ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"ස්වාමීන් හා උන්වහන්සේගේ ශක්තිය සොයව්, උන්වහන්සේගේ මුහුණ නිතරම සොයව්" (ගීතාවලිය 105:4)

83 වන වෙළුම අංක 06 (978) 2024 නොවැම්බර් / දෙසැම්බර්

දෙවියන් වහන්සේ පහළට පැමිණෙන සේක.

"අහෝ .., ඔබගේ විදිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔබ ඉදිරියෙහි ජාතීන් වෙවුලවන පිණිසද, ඔබවහන්ස් අභස පලාගෙන බසින්ටත්, ගින්න කැළෑව දල්වන්නාක් මෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් මෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියවයන්ටත් යෙදුනොත් හොඳය. (යෙසායා 64:1-2)

අනාගතවකතෘ යෙසායා ජීවත්වූයේ ඊශ්‍රායෙල් සෙනඟ පසුගාමී තත්ත්වයක සිටි කාලයකදීය. ඇගේ අයුතුකමේ කුසලානය සම්පූර්ණ වූ අතර ඉක්මනින්ම ඇයට මිත්‍යාදෘෂ්ඨික දේශයක වහල්කමට ගෙනයාමට නියමිතය. මනුෂ්‍යයන් බෙදී වෙන්ව සිටි නිසා දෙවියන් වහන්සේගේ ක්‍රියා මාර්ග ඉටු කිරීම කඳු මෙන් දුෂ්කරවී කිසිවක් පෙනෙන්නට නොමැතිවී තිබුණි. නරකම දෙය නම් ඔවුන්ගේ ඇල්මැරුණු ස්වභාවයයි. ඒ සමඟ කටයුතු කිරීම ලෝකයේ ඇති දුෂ්කරම දෙයයි. ඔවුන්ගේ විරුද්ධකාරයන් නුඹලාගේ දෙවියන් වහන්සේ කොහිදැයි කියමින් සමච්චල් කළෝය. එහෙත් මෙම උපහාසයෙන් ඔවුන්ට එතරම් කදරයක් නොවූයේ ඔවුන් අතරේ දේවභය පැවතියේ අල්ප වශයෙන් බැවිනි.

මෙම වාතාවරණය මැද දෙවියන් වහන්සේ ඔවුන් අතරට පැමිණෙන්නේ නම් පමණක්, දෙවියන් වහන්සේ උන්වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ කරන්නේ නම් පමණක් එහි සෑම ගැටළුවකට විසඳුම ලැබෙන බව යෙසායාට වැටහුණේය. උන්වහන්සේ ඉදිරියේ කඳු දියව යනු ඇත. සර්වබලධාරි දෙවියන් වහන්සේ ඉදිරියේ කිසිවකට සිටීමට නොහැකි විය. උන්වහ්නසේගේ පැමිණීම ප්‍රකාශවීමෙන් සෑම බාධාවක්ම බිඳ දමා බාධා කළ සියල්ල අතුගා දමනු ඇත. දෙවියන් වහන්සේගේ ගින්නෙන් මනුෂ්‍යයාව උණුකොට උන්වහන්සේගේ බලයෙන් ඔවුන්ව එකතු කරන බව ඔහු දුටුවේය. සියල්ලටම වඩා උන්වහන්සේගේ නාමය විරුද්ධවාදීන්ට ප්‍රකාශ කරනු ඇත. සැකයන් අතුගා දමනු ඇත. උන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේ ඉදිරියෙහි වෙව්ලනු ඇත.

ඒ හා සමාන තත්ත්වයක් අදද පවතියි.

අප ජීවත් වන්නේ යෙසායාගේ කාලයට සමාන කාලයක බවට සැකයක් නැත. ඇමරිකාවේ තත්ත්වය භයානක බව පෙනෙන්නේය. දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ සෑම ස්ථානයකම බෙදීම් පවතින්නේය. සෑම අතකින්ම බිය උපදවන ඇල්මැරුණු බවක් ඇත. දහස් ගණනකගේ ඇදහිල්ල අහිමි වී සහ ප්‍රථම ප්‍රේමය අත්හැර දමා ඇත. ගැටළුව විසඳිය හැකි එකම මාර්ගය දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශවීමයි. අපගේ සියලුම වැඩසටහන්, අපගේ දේශනා, අපගේ සංවිධාන, අපගේ ගායනා කණ්ඩායම්, වාද්‍යය කණ්ඩායම්, ගුවන්විදුලිය, රූපවාහිනිය සහ මනුෂ්‍යයාට කළ හැකි සියල්ල ගැටළුව විසඳීමට අසමත් වී ඇත.

එහෙත් අපට දෙවියන් වහන්සේ පහළට පැමිණ උන්වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ කිරීමට සැලැස්විය හැකි නම් උන්වහන්සේගේ අභිමුඛත්වයේ දී කඳු දියව යනු ඇත. දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ භේද පහව යනු ඇත. අපව එකම මහා ශරීරයක එක්සත්කමට ගෙන එනවා ඇත. ඊටත් වඩා දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශවීමත් සමඟ ඇල්මැරුණු මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ උදෙසා දැල්වෙනු ඇත. ඒ තුළින් වතුර උතුරවනු ලබන්නේය. ක්‍රිස්තුස් වහන්සේගේ සතුරන්ට උන්වහන්සේගේ බලය සැබෑ බව දැන ගැනීමට සලස්වනු ලබන අතර, එදිරිවාදීන්ට උන්වහන්සේගේ නාමය දැන ගැනීමට ලැබෙනු ඇත.

යෙසායාගේ වචන අපව ගෙනයන්නේ දෙවියන් වහන්සේගේ පැමිණීම සහ උන්වහන්සේගේ වාසය කිරීම අද දවසේ අප අතරේ මනුෂ්‍යයාගේ හදවතේ තිබෙන්නා වූ ගැටළුවලට විසඳුම බව පෙන්වා දීමටය. **"ඔබගේ නාමය කියා යාච්ඤා කරන්නා වූ ඔබ අල්චාගන්න පිණිස තමාම ප්‍රබෝධ කරගන්නා වූ කිසිවෙක් නැත. එක්නිසාද ඔබවහන්සේ ඔබගේ මුහුණ අපෙන් සඟවා අපේ අපරාධ නිසා අප දියවයන්නට හැරිය සේක."** (යෙසායා 64:7)

අපි සත්‍යතාවයට මුහුණ දෙමු. දෙවියන් වහන්සේ පහළට (අප අතරට) නොපැමිණෙන්නේ ඇයි කියා පැහැදිලිවම ප්‍රකාශ කර තිබෙන සේක. උන්වහන්සේගේ සෙනඟ පසුබෑම ලක්ව ඇත. දෙවියන් වහන්සේව අල්වා ගැනීමට ප්‍රායෝගිකව යාච්ඤාවෙන් තමන්වම පොළඹවාගන්නා වූ මනුෂ්‍යයක්ව සොයාගත නොහැකිව තිබේ. කොයිතරම් අයහපත් තත්ත්වයක් පැවතියද දෙවියන් වහන්සේගේ සෙනඟට දෙවියන් වහන්සේගේ නම කියා අයැද සිටීමට හැකි නම් දෙවියන් වහන්සේ පහළට පැමිණෙන බව මෙම වචනයේ පැහැදිලි කර ඇත.

ඉතිහාසයේ සභාව තුළ බොහෝ අවස්ථාවලදී මෙය සනාථ කර ඇත. ලෝකය සෙලවීමට දෙවියන් වහන්සේගේ බලය ලැබුවා වූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් සෑම කෙනෙක්ම යාච්ඤාවේ පවතින්නා වූ අයයි. දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය නැවත ජනතාව වෙත ගෙන ඒම සඳහා ඇති එක් ප්‍රබල මාධ්‍යයක් වන්නේ යාච්ඤා කිරීම තුළ පැවතීමයි. ප්‍රසව වේදනාවෙන් යුතුව යාච්ඤා නොකිරීම දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ තිබෙන ලොකුම අඩුපාඩුවයි. අතීතයේ දී යාච්ඤා කිරීමට තිබූ පෙළඹවීම අද කිතුණු රටවල දැක ගැනීමටවත් නැති තරම්ය. නමුත් ලෝක ඉතිහාසයේ කිසිදාක යාච්ඤා කරන්නේ නැතිව ශුද්ධාත්මයාණන් වහන්සේගේ පිඹීදීමක් සිදුවී නැති බව අපි මතකයේ තබාගත යුතුය. යාච්ඤා කිරීම ජයග්‍රහණය ගෙන දෙන්නා වූ යාච්ඤාවක් විය යුතුය. දෙවියන් වහන්සේව අවංකව අල්ලා ගැනීමට තරම් ආත්මයේ උද්යෝගිමත් බවකට මනුෂ්‍යයාව පෙළඹවූයේ යාච්ඤාවයි.

දැඩි වේදනාවෙන් යුතු යාච්ඤාවේ මාස

ඊවන් රොබට්ස්ගේ කාලයේ එය සැබෑවිය. ඔහුගේ ජීවිතයේ පමණක් නොව වේල්සයේ තවත් බොහෝ දෙනෙකුගේ ජීවිතයේ දැඩි වේදනාවෙන් යුක්තව යාච්ඤාව පැවතියේය. අවසානයේදී දෙවියන් වහන්සේ ස්වර්ගය විවර කරගෙන (අභස පලාගෙන) පහළට පැමිණි සේක. හදවත විවෘත කරන්නා වූ මනුෂ්‍යයන් මත දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ ක්‍රියා කිරීම ආරම්භ වූ බව පිඹීදීමේ රැස්වීම්වලදී බොහෝ වාරයක් මම දැක ඇත්තෙමි. එමෙන්ම දෙවියන් වහන්සේ පිළිබඳව පිපාසයෙන් සිට අය එම ස්වර්ගීය පෙළඹවීම ඔවුන් මත ඇතිවන තුරු අතීතයේ දී යාකොබ් කලාක් මෙන් මුළු රාත්‍රියේම පොරබදිමින් යාච්ඤා කළෝය. (උත්පත්ති 32:24-30)

ප්‍රසව වේදනාවෙන් යුතුව යාච්ඤා කිරීමේ ප්‍රතිඵලය ලෙස අරුම පුදුම ක්‍රියාවන් සිදුවන බව මම දැක ඇත්තෙමි. දෙවියන් වහන්සේව සැබෑ ලෙස සොයමින් දැඩි ඕනෑකමකින් යාච්ඤා කරන ඕනෑම තැනකදී දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය පහළට පැමිණීම සිදුවන බව මම විශ්වාස කරමි. (දානියෙල් 9:1-23) **"මෙබදු දේ ඇසුවේ කවුද ? මෙබදු දේ දුටුවේ කවුද ..? එක දවසක දී දේශයක් උපදිනවා ඇද්ද ....? සියොන් ප්‍රසව වේදනාව වින්ද ඇසිල්ලෙහිම ඇගේ දරුවන් වැදුවාය."** (යෙසායා 66:8)

යාච්ඤාවෙන් අදහස් කරන්නේ යුද්ධයකි.

එබැවින් දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ බොහෝ දෙනෙක් නොසලකා හැර ඇති එක් අතිමහත් සත්‍යතාවයක් මෙහිදී ඔබ දැකීම මට අවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේ සතුරාට එරෙහිව අපගේ අතේ තබා ඇති විශාලතම ආයුධය යාච්ඤාවේ බලය බව සාතන් දැන සිටියි. මනුෂ්‍යයන්ව යාච්ඤාවෙන් වළක්වා ගත හැකි නම් පිඹීදීම නවත්වා ගත හැකි බව සාතන් දන්නේය. එම නිසා ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැබෑ ආත්මය මනුෂ්‍යයන් අතරට පැමිණීම වැළැක්වීමට ඕනෑම දෙයක් සහ සියලුම දේ කරනු ලබයි.

යහපත් කාරණා සමඟ කාර්යබහුලවීම.

ඔබ යාච්ඤා කිරීමට පටන් ගන්නේ නම් යාච්ඤා කිරීම සඳහා ඔබ ආත්මික ක්ෂේත්‍රය තුළ සැබෑ සටනකට මුහුණ දෙනු ඇත. යක්ෂයා ඔබට නිදමත ගෙන එනු ඇත. නැතිනම් ඔබගේ මනස වෙනත් දෙයකට යොමු කරනවා ඇත. ඔබව යාච්ඤා කිරීමෙන් වැළැක්වීමට සාතන් ඉරයට ඕනෑම දෙයක් කරනු ඇත. ඔබේ යාච්ඤාවලට පිළිතුරු ලබාගත හැකි නම් ඔබට ලෝකයේ ඕනෑම ගැටලුවක් විසඳා ගත හැකි අතර දෙවියන් වහන්සේ උදෙසා ඕනෑම අරමුණක් ඉටු කළ හැකි බව සාතන් දන්නේය.

දේශනා කිරීමට දෙවියන් වහන්සේගේ සැලැස්ම තුළ පුදුමාකාර ස්ථානයක් පැවතුණත් දැඩි වේදනාවකින් යුතුව යාච්ඤා කිරීමෙන් ඊට අනුබල නුදුන්නේ නම් අදඅ පට අත්‍යාවශ්‍යය ශුද්ධාත්මයාණන් වහන්සේගේ නැවත පිඹීදීම අත්දැකිය නොහැකිය. අපගේ යාච්ඤාවලට පිළිතුරු ලබාගත හැකි නම් දෙවියන් වහන්සේ වෙනුවෙන් ඕනෑම දෙයක් කළ හැකිය. ඇදහිල්ලේ යාච්ඤාවෙන් ඕනෑම දෙයක් කළ හැකිය. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. **" උන්වහන්සේ කියන සේක්, නුඹලාගේ අදහිල්ලේ වදිකම නිසාය සැබවක් නුඹලාට කියමි. අඹ ඇටයක් පමණ අදහිල්ල නුඹලාට ඇත්නම් වේ කන්දට කතාකොට වෙතනින් අහක්ව එතනට යවයි කීවත් ඒක යන්නේය. කිසිවක් නුඹලාට බැරි නොවන්නේ යයි කී සේක."** (මතෙව් 17:20-21) යක්ෂයා මෙය දන්නා නිසා අද සාතන් දෙවියන් වහන්සේගේ සෙනඟට එල්ල

2 පිටුවට

1 පිටුවෙන්

දෙවියන් වහන්සේ පහළට ...

කරන සැබෑ ප්‍රහාරය වන්නේ යාච්ඤාවේ ආත්මයට එරෙහි ප්‍රහාරයකි. ඔවුන් එහි වැදගත්කම දැකීමෙන් වළක්වා ගැනීමට සහ දෙවියන් වහන්සේ මත රැඳී සිටීමට එරෙහිව ප්‍රහාරය එල්ල කරනු ලබයි.

වගකීම

යාච්ඤාවෙන් දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ සිටීමේ වගකීමට අපි මුහුණ දිය යුතුද ..? අපට එය මගහැරීමට නොහැකිය. දැන් අපි එය ප්‍රතික්ෂේප කිරීමට පුළුවන. නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනයේ දී අපට එයට මුහුණදීමට සිදුවනු ඇත. එවිට එය ප්‍රමාද වැඩි වන්නේය. දෙවියන් වහන්සේගේ බලය තුළින් බලවත් ජයග්‍රහණය සඳහා ඇති අවස්ථාව සඳහටම නැතිවී යනු ඇත. අපට මෙම වගකීම වෙනත් කෙනෙකු මත පැටවිය නොහැකිය. අප සෑම කෙනෙකුම එය අපගේම ලෙස මුහුණදිය යුතුය.

දැන් අපි මේ කාරණය දෙස කෙලින්ම බලමු. දෙවියන් වහන්සේ මෙහි නොපැමිණීමට හේතුව අපට පෙන්වා දී ඇති බව අපි හඳුනාගනිමු. උන්වහන්සේගේ සෙනඟ පසුබෑමකට ලක්ව සිටින නිසාත් කිසිවෙක් උන්වහන්සේගේ නාමයෙන් අයැද නොසිටීම නිසාත් එසේ සිදු ව ඇත. එම ප්‍රකාශය තුළ "කැදවා තිබීම" යන්නට විශාල වැදගත්කමක් ඇත. එය බලාපොරොත්තු සුන්වීම ප්‍රකාශවන අවස්ථාවකි. එය අනාචාරයට සහ කලබලකාරී වාතාවරණයකට මනුෂ්‍යයාව ඇද දමා තිබෙන බව පෙන්නුම් කරනු ලබයි. ප්‍රධාන දෙය නම් යෙසායා පවසන්නේ දෙවියන් වහන්සේව අල්ලා ගැනීමට තමාවම පොළඹවා ගන්නා වූ කිසිවෙක් නැති බවයි. ඔහු මෙය පෙන්වා දෙන්නේ යාච්ඤාව යුද්ධ ශූමියක් නිසාත්, සතුරා හුස්ම හිර කිරීමට සහ යාච්ඤාවේ ආත්මයට බාධා කිරීමට කල හැකි සෑම දේම කිරීමට යන නිසාත් ඵලදායි ලෙස යාඥා කිරීමට හැකිවීම සඳහා මනුෂ්‍යයෙක් අනිවාර්යයෙන්ම තමාවම පුබුදුවා ගත යුතු බව පැහැදිලි ලෙස පෙන්වාදීමට වන්නේය.

අද දවසේ මහත් වූ ප්‍රශ්නය

දෙවියන් වහන්සේගේ සෙනඟට සැබවින්ම යාච්ඤාවෙන් ජය ගැනීමට අවශ්‍ය නම්, ඔවුන් තමන්වම පුබුදුවා ගත යුතු බවත් ඔවුන් යාච්ඤාවෙන් ජයගන්නේ නම් මිස දෙවියන් වහන්සේ බැස ඇවිත් උන්වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ නොකරන බවත් අපි තේරුම් ගත යුතුය. එබැවින් සටන ඇත්තේ මෙතැන බව අපි දැකිය යුතුය. අපගේම මාංශයට එරෙහිව කරන සටන අද දවසේ මහත් අවශ්‍යතාවයක් වී ඇතත් එය අලස, නිදහසේ ආශාවන් සපුරා ගැනීමට ඉඩදෙන උදාසීන තත්ත්වයට පත්කර ඇත. ඔබ ඔබවම පුබුදුවා ගැනීමෙන් යම් දෙයක් අදහස් වේ. එයින් අදහස් කරන්නේ ඔබ ඔබේම මාංශයේ ප්‍රවණතාවලට (නැඹුරුවීම්වලට) එරෙහිව, ඔබගේ මාංශයේ ආශාවලට විරුද්ධව වුවත් ඔබ ඔබවම පුබුදුවාගත යුතු බවත් අවබෝධ කරගත යුතුය. එසේ නොමැති නම් එවැනි ආඥාවක් අවශ්‍ය නොවේ.

දෙවියන් වහන්සේ අප තුළ සැබෑ ප්‍රේමයේ හදවතක් උන්වහන්සේගේ කාර්යය කෙරෙහි උන්නදුවක් දක්වන හදවතක් ඉල්ලා සිටින සේක. අප සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට පෙර එම ප්‍රේමයේ හදවත බලාපොරොත්තු වන සේක. අපව පුබුදුවා ගැනීම අප විසින්ම කළ යුතුය. අපගේ හදවත් දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධ කිරීමට කැමතිවන තුරු දෙවියන් වහන්සේට අප සමඟ සහයෝගයෙන් කටයුතු කළ නොහැකි අතර උන්වහන්සේගේ ආශීර්වාදය සහ උන්වහන්සේගේ බලය සමඟ අපව විශ්වාස කිරීමට පෙර අපගේ හදවතේ ප්‍රේමයේ ප්‍රකාශයත්, උන්වහන්සේගේ අරමුණට විශ්වාසවන්තභාවයත් තිබිය යුතුය. අද දවසේ ලොව පුරා මනුෂ්‍යයන් තමන්වම පුබුදුවාගෙන දෙවියන් වහන්සේව අල්ලා ගැනීමට කැඳවා තිබීමේ මහත් වූ හෙතුව එයයි. අපි මෙය ඉටුකරන්නේ නම් දෙවියන් වහන්සේ අප වෙතට පැමිණ උන්වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ කරන බවට සැකයේ සෙවණැල්ලක් ලෝකයේ නැත.

එබැවින් ඔබ කවුරුන් වුවද යාච්ඤා කිරීමේ දැවැන්ත වැදගත්කම හඳුනාගන්න. දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය සඳහා මොරගැසීමේ අවශ්‍යතාවය දකින්න. දෙවියන් වහන්සේගේ පැමිණීම ප්‍රකාශ කිරීමට එකම මාර්ගයක් පමණක් ඇති බව පිළිගන්න. එය ඔබව සැබෑ මැදහත්කරුවෙක් බවට පත්කරනු ඇත. ඔබ දෙවියන් වහන්සේව අල්ලා ගැනීමට එසේ ඔබවම පුබුදුවා ගන්නේ නම් දෙවියන් වහන්සේ උන්වහන්සේගේ අභිමුඛත්වය ඔබ අතරේ ප්‍රකාශ කරනු ලබනවා ඇත. ඔබ සටනෙන් මිදී නොයන බව දෙවියන් වහන්සේගේ අනුග්‍රහයෙන් අවබෝධ කරගන්න. ඔබ මේ මාර්ගයේ ගමන් කරමින් ජයග්‍රහණය අපේක්ෂා කරන විට සාතන් විශාල විරුද්ධවාදිකම් ගෙන එනවා ඔබට අත්දකින්නට ලැබේ.

යක්ෂයා සෑම අංශයකින්ම ඔබව වටකර ගැනීමටත් හැකි සෑම ආකාරයකින්ම ඔබට විරුද්ධවීමටත්, ඔබව අධෛර්යමත් කිරීමටත් හැකි සෑම දෙයක්ම කරන බව අවබෝධ කරගන්න. නමුත් සහෝදරයා, සහෝදරිය යාච්ඤා කරන්න සටනට මුහුණ දී අවසානය දක්වා සටන් කරන්න. දෙවියන් වහන්සේ ඉදිරියෙහි ඔබගේ මුහුණ ඔසවන්න. නැගී සිටිමින් දෙවියන් වහන්සේව අල්ලාගන්නා තෙක් එහිරැදී සිටින්න. ඔබට නිදිමත ගතියක් හෝ ඔබගේ මනස නිදැල්ලේ යන බවක් ඔබට දැනෙන්නේ නම් ඔබේම මාංශයට විරුද්ධව නැගී සිටින්න. දානියෙල් මෙන් ඔබගේ මුහුණ ස්වාමීන් වහන්සේ දෙසට යොමු කරන්න. හදවතේ අරමුණ සහ ඔබගේ ආත්මයේ සියලු අධිෂ්ඨාන සමඟ දෙවියන් වහන්සේව අල්ලා ගැනීමට ඔබවම පුබුදුවාගන්න.

ජාතියේ බලාපොරොත්තුව සඳහා සැබෑ මූලාශ්‍රය

රිව් කාර්මයිකල් විසිනි

ඇමරිකා එක්සත් ජනපදයේ වැඩි අවධානය යොමු වී ඇත්තේ නව ජනාධිපතිවරයෙකු පත්කර ගැනීම සඳහා වන අතර ඔබ මෙය කියවනවිට දැනටමත් එය ඉටුවී තිබෙනු ඇත. ජනාධිපතිවරයා රටේ අනාගතයට සහ ඉන් ඔබ්බට ඇති කරන සැලකිය යුතු බලපෑම අනුව එවැනි අවධානයක් යොමුවීම තේරුම්ගත හැකිය. ප්‍රධාන දේශපාලන පක්ෂ සහ ඇමරිකානු ජනතාව වෙනස් මත දරණ කණ්ඩායම් දෙකක් වී ඇත. මෙම ඡන්ද විමසීමේදී ඊට වඩා ඇතිවිය හැකි අවධානමක් නොමැත. කෙසේ වෙතත් මතකයේ තබාගත යුතු වැදගත් දෙයක් නම් ඇමරිකා එක්සත් ජනපදයේ හෝ වෙනත් ඕනෑම රටක යහපැවැත්ම අවාසනයේදී දේශපාලනමය හෝ රාජ්‍යමය කාරණයක් නොව එය අධ්‍යාත්මික කාරණයක් බවයි. ඇත්ත වශයෙන්ම රජයන්ට දෙවියන් වහන්සේ ලබාදෙන භූමිකාවක් ඇත. එම භූමිකාවන් ඉතා වැදගත්වේ. තවද දෙවියන් වහන්සේගේ සෙනඟ ලෙස අපව කැඳවනු ලබා ඇත්තේ රජයට යටත්වීමට සහ බලයේ සිටින අය වෙනුවෙන් යාච්ඤා කිරීමටයි. (රෝම 13:1, 2 තිමෝති 2:1-2) නමුත් ඒ සමඟම අපගේ බලාපොරොත්තුව රජය වෙත තැබීමට දෙවියන් වහන්සේ අපව කැඳවා නැත. අපගේ බලාපොරොත්තුව ස්වාමීන් වහන්සේ කෙරෙහි පමණක් තබමු. "මාගේ කොටස නම් ස්වාමීන් වහන්සේ යයි මාගේ ආත්මය කියයි. එබැවින් උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි. (විලාප ගී 3:24) අපගේ බලාපොරොත්තුව දෙවියන් වහන්සේ තුළ, උන්වහන්සේගේ වචනය තුළ, උන්වහන්සේගේ ගැලවීම හා දයාව තුළ නතර වී ඇත. (ගීතාවලිය 119:114, 119:166, 147:11)

මාගේ සෙනඟනම් ...,

2 ලේකම් 7:14 වන පදයේ සඳහන් උන්වහන්සේගේ පොරොන්දුව මේ සියල්ලටම සම්බන්ධ වන්නේය. **"මාගේ නාමය දරණ මාගේ සෙනඟ යටත්වී යාච්ඤා කර මාගේ මුහුණ සොයා තවුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත් මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි."** (2 ලේකම් 7:14) අපගේ ජාතිය වෙනස් වන්නේ ස්වාමීන් වහන්සේ අපගේ බලාපොරොත්තුව නිසාය. ස්වර්ගයේ සිට අසා අපේ පව් අපට කමාකර අපගේ දේශය සුවකරන සේක. එවිට නැවතත් දේශපාලකයින්ට සහ රජයන්ට ඔවුන්ගේ භූමිකාව ඉටුකළ හැකිය. නමුත් ඔවුන්ට අපට ආත්මික ජීවිතයක් ගෙනදීමට සහ අපට අවශ්‍ය වන්නා වූ වෙනස්වීම ඇති කළ නොහැකිය. එය කළ හැකි වන්නේ ස්වාමීන් වහන්සේට පමණක් වන සේක.

එමෙන්ම මේ සඳහා මාර්ගය සකසන්නේ කුමක්ද ..? අපි උන්වහන්සේගේ සෙනඟ ලෙස අපවම යටහත් කරගෙන යාච්ඤාකර උන්වහන්සේගේ මුහුණ සොයමින් අපගේ නපුරු මාර්ගවලින් හැරුණොත් දෙවියන් වහන්සේගේ සෙනඟ ලෙස අප කරන දේ අපේ රටේ යහපැවැත්මට රජය කරන දෙයට වඩා බෙහෙවින් බලපාන බව අප තේරුම් ගත යුතුය. යේසුස් වහන්සේ අපට මතක් කර දෙන පරිදි අපි පොළොවේ ලුණු සහ ලෝකයේ ආලෝකයයි. (මතෙව් 5:13-16)

අන්තිම දවස්

මෙම කැඳවීම සැමවිටම වැදගත් වුවත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීමට පෙර මෙම තීරණාත්මක අවසාන දවස්වල වැදගත්කම ඉතා විශාලවේ. අපොස්තුළු ප්‍රේත්‍රුස් මෙසේ ලියා තිබේ. **"නමුත් සියලු දේවල අන්තිමය ළංවී තිබේ. එබැවින් නුඹලා සිහියෙන් යුක්තව සිට යාච්ඤා කිරීම පිණිස පිබිද සිටපල්ලා "** (1 ප්‍රේත්‍රුස් 4:7) ප්‍රේත්‍රුස් මේ වචන ලියූ විට සත්‍යවූ දේ අපේ කාලයේ දී වඩා අත්‍යාවශ්‍යව තිබේ. ඇත්ත වශයෙන්ම කාලය ඉතා කෙටි වන අතර දැන් බැරෑරුම් ලෙස සෝදිසියෙන් සහ යාච්ඤාවෙන් සිටිය යුතු පැයයි. මෝර්දෙකයි එස්තර්ගෙන් ඉල්ලා සිටියාක් මෙන් අපි යාච්ඤා කළ යුතු පැයේ සිටින්නේය. **"එක්නිසාද මේ ප්‍රස්ථාවේදී නුඹ නිශ්ශබ්දවම සිටියොත් වෙන තැනකින් යුදෙව්වරුන්ට නිදහසත්, ගැලවීමත් පැමිණෙනවා ඇත. නමුත් නුඹ සහ නුඹේ පියවංශය නැතිවන්නේය. නුඹ රාජ්‍යයට පැමුණුනේ මෙවැනි ප්‍රස්ථාවක් නිසාම නොවේද කියා දන්නේ කවුදැයි කියා කියන්ට අණකළේය."** (එස්තර් 4:14) තත්ත්වය බරපතල වූ අතර එස්තර් ඒ අනුව උචිත ලෙස ප්‍රතිචාරය දැක්වූවාය.

එස්තර් රජ සමඟ කථා කිරීමට ඉදිරියට යාමට ඉක්මන් නොවී ඊට පෙර ස්වාමීන් වහන්සේ වෙතට හැරීමට යොමු වූවාය. ඇය මොර්දෙකයිට මෙසේ උපදෙස් දුන්නාය. **"ගොස් සුෂන්හී සිටින සියලු යුදෙව්වරුන් රැස්කරවා මා උදෙසා ඔවුන් සමඟ දවස් තුනක් රෑ දහවල් නොකා නොබී නිරාහාරව සිටින්න. මමත් මගේ වැඩකාරියොත් එසේම නිරාහාරව ඉන්නෙමුව. එවිට නීතියට එකඟ නැති නමුත් මම රජු ළඟට යන්නෙමි. මා නැතිවුණොත් නැති වුනාවේ කියා කියන්ට කීවාය."** (එස්තර් 4:16) එවැනි නිහතමානී කැපවීම, මැදිහත්වීම්වලට ප්‍රතිචාරය දැක්වීමට ස්වාමීන් වහන්සේ විශ්වාසවන්තව ක්‍රියා කරමින් උන්වහන්සේ මැදිහත්වී තම සෙනඟව බරපතල අනතුරෙන් ගලවාගත් සේක.

අවාසනාවකට මෙන් දෙවියන් වහන්සේට එවැනි අවස්ථාවලදී මැදිහත්වීමෙන් තමන්වහන්සේ වෙතට හැරෙන අයව සොයා ගැනීමට සෑම අවස්ථාවකදීම නුපුළුවන. යෙසායගේ දවස්වලදී ස්වාමීන්

3 පිටුවට

2පිටුවෙන්

ජාතියේ බලාපොරොත්තු...

වහන්සේට එවැනි මැදහත්කරුවෙකු සම්බවූයේ නැත. **“උන්වහන්සේද කිසිවෙක් නැති බව දැක මැදහත්කාරයෙක් නැති බැවින් පුදුම වූ සේක. ඒ නිසා උන්වහන්සේගේම බාහුව තමන්වහන්සේට ගැලවීම ගෙනයේය. උන්වහන්සේගේම ධර්මිෂ්ඨකම උන්වහන්සේව ඉසුලුවේය.” (යොසායා 59:16) එසකියෙල්ගේ දවස්වලදී දෙවියන් වහන්සේගේ මෙසේ ප්‍රකාශ කරන සේක. “මා විසින් දේශය නාස්ති නොකරන පිණිස පවුරක් ගොඩනගා දේශය උදෙසා මා ඉදිරිපිට කඩුල්ලෙහි සිටීමට ඔවුන් අතරේ මනුෂ්‍යයෙකු සෙවීමි. නමුත් කිසිවෙක් මට සවිබනූණේය.”** (එසකියෙල් 22:30) අපගේ ප්‍රශ්නය වන්නේ අද දවසේ අපට අත්‍යාවශ්‍ය පිඹීදීම සඳහා යාච්ඤාවෙන් සහ මැදිහත්වීමෙන් උන්වහන්සේ ඉදිරියේ තමන්ව යටහත් කරගෙන පාපයෙන් හැරී සම්පූර්ණයෙන්ම ස්වාමීන් වහන්සේව සොයන අයව දෙවියන් වහන්සේට සොයා ගැනීමට හැකිද යන්නයි. මේ සියල්ල මතකයේ තබාගෙන යාච්ඤාව සම්බන්ධව මෙම කලාපයේ ඇති ලිපිවලින් ඔබට බොහෝ දිරිමත්වීමක් සහ පෙළඹවීමක් ඇතිවනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු. අපේ දෙවියන් වහන්සේ අපේ යාච්ඤාවලට ඇහුම්කන්දීමට කරුණාවන්තව සහ විශ්වාසවන්තව සිටින බව දැනගෙන අපගේ ජීවිත තුළ, අපගේ දේවස්ථානවල, අපගේ ජාතිය, තුල උන්වහන්සේගේ අරමුණ ඉටු කිරීමට ඒ තුළින් ක්‍රියාකිරීම කොපමණ යහපත්ද ..?

යෙසායා 64:1-2 පදවලින් මුල් පිටුවේ සඳහන් ප්‍රධාන ලිපියේ අවධාරණය කරන පරිදි කඳු සෙලවෙන පිණිසත්, ජාතීන් උන්වහන්සේගේ අභිමුඛයේදී වෙව්ලන පිණිසත් අපට ස්වාමීන් වහන්සේ අහස පලාගෙන බැසීම අවශ්‍යව තිබේ. මෙම කලාපයේ ලබාදෙන දිරිගැන්වීම සැලකිල්ලට ගන්න. **“අහෝ ඔබගේ විඳිරිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔබ ඉදිරියෙහි ජාතීන් වෙව්ළුවන පිණිසද ඔබවහන්සේ අහස පලාගෙන බසින්නත්, ගින්න කැළැව දැල්වන්නාක් වෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් වෙන්ද ඔබ ඉදිරියෙන් කඳුදියවයන්නත්, යොදුණොත් හොඳය.”** (යෙසායා 64:1-2)

පිඹීදීම ගෙන දෙන යාච්ඤාව

අර්නස්ට් එම්. වැඩ්ස්වර්ත් විසිනි.

“ඔවුන් යාච්ඤා කළ පසු ඔවුන් රැස්ව සිටි ස්ථානය කම්පාවිය. ඔවුන් සියල්ලෝද ශුද්ධාත්මයෙන් පූර්ණව, දෙවියන් වහන්සේගේ වචනය නිර්භීත ලෙස කතා කළෝය. අදහාගත් සමූහයා එක සිතකින් හා එක ආත්මයකින් යුක්ත වූහ. කිසිවෙක් තමාට අයිති දේවලින් කිසිවක් තමාගේම යයි නොකීවේය. සියල්ල ඔවුන්ට පොදුවේ තිබුණේය. ස්වාමී වූ යේසුස් වහන්සේගේ නැවත නැගිටීම ගැන ප්‍රේරිතයෝ මහත් බලයෙන් සාක්ෂි දුන්නෝය. මහත් අනුග්‍රහය ඔවුන් සියල්ලන් කෙරෙහි තිබුණේය.” (ක්‍රියා 4:31-33)

පිඹීදීම සඳහා කරන යාච්ඤාව අනිත් සෑම ආකාරයේ කාරණාවක් උදෙසාම කරන යාච්ඤාවලට වඩා වෙනස්ව තිබේ. එවැනි ප්‍රතිඵලදායක යාච්ඤාවන් පිළිබඳ බොහෝ උදාහරණ ශුද්ධ ලියවිල්ලේ දක්වා ඇත. ඔවුන් තුළ අපි වෙනත් යාච්ඤාවන් හි නොදක්නා සාධක දකින්නෙමු. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ ක්‍රියාව ඉටුකරනු ලැබීම සඳහා පෙන්තකොස්ත රහස ඔවුන් තුළ ඇත. ඔවුන් යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ සමඟ එක්වීම වඩාත් සමීපය. ඔවුන් වඩාත් මැදිහත් වන්නෝය. ඔවුන් ආත්මයේ ආශාවන් ගැන හඬ නගයි. ඔවුන් ස්වර්ගය සොලවා ආශිර්වාද වර්ෂාවක් ගෙන්වා ගැනීම පුදුමයක්ද ?

එළියා මේ ආකාරයෙන් යාච්ඤා කරමින් පිඹීදීමේ ආශිර්වාද දින ගෙනාවේය. ඔහු පැවසුවේ..., **“ස්වාමීන් වහන්ස ..., මට උත්තර දුන මැනව. ස්වාමී වූ ඔබ දෙවියන් වහන්සේ බවත් වේ සෙනඟගේ සිත් නැවත හරවාගන්නේ ඔබම බවත් මොවුන් දැනගන්නා පිණිස මට උත්තර දුන මැනවයි කීවේය. එවිට ස්වාමීන් වහන්සේ වෙතින් ගිනි බැස පූජාවත් දර්ත්, ගලුත්, ධූලිත් දවා අගලේ වතුරත් වියලවා දැම්මේය.”** (1 රාජාවලිය 18:37-38)

එස්රාගේ පිඹීදීමේ යාච්ඤා කිරීම තුළ ජාතියේ පවිත්‍රත්වය ලබාගත්තේය. පූජකයන් සහ සෙනඟ දේශවාසීන් වන අන්‍යජාතීන්ගේ ස්ත්‍රීත්ව තමන් වෙනුවෙන් සහ තම පුත්‍රයන් වෙනුවෙන් ලබාගෙන ඇත. ශුද්ධ වූ සෙනඟ දූෂිත වී ඇත. මෙම අපරාධයේ දී කුමාරවරුන් සහ අධිපතීන්ගේ හස්තය ප්‍රධාන විය. එස්රා මෙසේ යාච්ඤා කළේය. **“මාගේ දෙවියන් වහන්ස ..., මම ලැජ්ජාවට පත්වී මාගේ දෙවි වූ ඔබ දෙසට මාගේ මුහුණ ඔසවන්ට විලිහියෙන් සිටිමි. මක්නිසාද අපේ අපරාධ අපේ ඉස්වලටත් උඩින් වැඩිවී අපේ වරදකාරකම ස්වර්ගය දක්වා නැගී තිබේ.” (එස්රා 9:6) “එස්රා අඬවින් දෙවියන් වහන්සේගේ ගෘහය ඉදිරියේ වැටී ඉඳ යාච්ඤාකොට පව් කියා සිටියදී ඊශ්‍රායෙල්වරුන්ගේ පුරුෂයන් ද, ස්ත්‍රීන් ද, ළමයින් ද, ඉතාමහත් සමූහයක් ඔහු වෙතට රැස්වුණෝය. මක්නිසාද සෙනඟ බොහෝ සෙයින්ම ඇඬුවෝය. එවිට එලාමිගේ පුත්‍රයෙක් වූ යෙහියෙල්ගේ පුත්‍රවූ ෂෙකනියා එස්රාට උත්තර දෙවින් අපේ දෙවියන් වහන්සේට විරුද්ධව වරදකොට දේශයේ ජනයන්ගෙන් අන්‍යජාතී ස්ත්‍රීන් පවා ගනිවු. එසේ වුවත් ඊශ්‍රායෙල්ට වේ ගැන බලාපොරොත්තු තිබේ. ඒ නිසා ඒ සියලු භාර්යාවන්ද ඔවුන්ගෙන් උපන් දරුවන් ද පහකරන ලෙස මාගේ ස්වාමීනුගේ ද අපේ දෙවියන් වහන්සේගේ ආඥාවට වෙවුලන්නන්ගේ ද දැනවුත්කමේ හැටියට අපේ දෙවියන් වහන්සේ සමග ගිවිසුමක් කරමු. ව්‍යවස්ථාව ලෙසද කරනු ලැබේවා.”** (එස්රා 10:1-3) දෙවියන් වහන්සේ මෙසේ ජාතිය බේරාගත් සේක.

පෙන්තකොස්ත දිනට පසු යාච්ඤාවේ යෙදුන ප්‍රේරිතයන් දෙවන පුනර්ජීවනය ලබාගත්හ. **“ඔවුහු ඒ අසා එක්සිත්ව දෙවියන් වහන්සේට හඬනගා අහසත්, පොළවත්, ඔහුදත් එහි ඇති සියල්ලත් මැවූ ස්වාමිනී, ඔබගේ මෙහෙකරු වූ අපගේ පියවූ දාවිත්ගේ මුඛයන් ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකාටගෙන ඔබ කතාකොට, අන්‍යජාතීහු කුමට කෝලාහල කළෝද ..? ජනයෝ කුමට නිශ්චල දේ සිතත් ද..? ස්වාමීන් වහන්සේට ද උන්වහන්සේගේ ක්‍රිස්තුස් වහන්සේට ද විරුද්ධව පොළොවේ රජවරු සැරසී සිටියෝය. ආඥාකාරයෝ එක්ව රැස්වූවෝයයි කී සේක. කුමක් හෙයින්ද ඔබගේ අතින්ද ඔබගේ මන්ත්‍රණයෙන්ද සිද්ධවෙන්ට නියම කළ කොයි දෙයක් නමුත් ඉෂ්ට කරන පිණිස ඔබ ආලේප කළ ඔබගේ ශුද්ධ සේවකවූ යේසුස් වහන්සේට විරුද්ධව සැබවින් හෙරෝද්ද පොන්තියුස් පිලාත්ද, අන්‍යජාතීන් හා ඊශ්‍රායෙල් සෙනඟ සමඟ වේ නුවර රැස්වූවෝය. දැනුදු ස්වාමීනි ඔවුන්ගේ තර්ජන බලා සුවකිරීමට ඔබගේ අත දිගු කරන කළ ඔබගේ වචනය නිර්භීතකමින් කථාකරන්නට ඔබගේ ශුද්ධ සේවකයා වූ යේසුස් වහන්සේගේ නාමය කරුණුකොටගෙන හාස්කම්ද, පුදුම ද කරන්නත් ඔබගේ දාසයන්ට වරදාන මැනවයි කීවෝය. ඔවුන් යාච්ඤා කළ පසු ඔවුන් රැස්ව සිටි ස්ථානය කම්පාවිය. ඔවුන් සියල්ලෝද ශුද්ධාත්මයෙන් පූර්ණව දෙවියන් වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථා කළෝය.”** (ක්‍රියා 4:24-31) ඵලදායි පිඹීදීමේ යාච්ඤාවේ කැපී පෙනෙන ලක්ෂණ නම් කිරීමට අපි දැන් උත්සාහ කරමු.

(1) පිඹීදීම උදෙසා කරන යාච්ඤාව යනු කෙඳිරිගෑමෙන් යුතුව කරන යාච්ඤාවයි.

වහල්භාවයේ නිවසේදී ඊශ්‍රායෙල්වරුන් කළ යාච්ඤාවත් එබදුය. ඔවුන් ස්වාමීන් වහන්සේට කෙඳිරිගෑවෝය. (නික්මයාම 2:24) මෙම කෙඳිරිගාන යාච්ඤාව දවසේ අනුපිළිවෙල විය. සාමුවෙල් ඊශ්‍රායෙල්ට කළ අවසාන දේශනාවේදී මේ බව සඳහන් කරයි. ඔහු මෙසේ කීවේය. **“යාකොබ් විසරයට පැමිණියාට පසු නුඹලාගේ පියවරුන් ස්වාමීන් වහන්සේට මොරගැසූවිට ස්වාමීන් වහන්සේ මෝසෙස්ද, ආරොන්ද යවා නුඹලාගේ පියවරුන් විසරයෙන් ගෙන්වා මේ ස්ථානයෙහි වාසය කරවූ සේක.”** (1 සාමුවෙල් 12:8) හිරිහැරයට පත්ව සිටින දෙවියන් වහන්සේගේ ශුද්ධවන්තයන්ගේ කෙඳිරිගෑම් ඇසෙන විට උන්වහන්සේ ඔවුන්ට උපකාර කිරීමට නැගී සිටින සේක. **“මෙබඳු දෙයක් ඇසුවේ කවුද ..? මෙබඳු දේ දුටුවේ කවුද ..? එක දවසකදී දේශයක් උපදිනවා ඇද්ද.. ? නොහොත් සෙනඟක් එකවිටම උපදිනවා ඇද්ද.. ? සියොන් ප්‍රසව වේදනා වින්ද ඇසිල්ලෙහිම ඇගේ දරුවන් වැදුවාය.” (යෙසායා 66:8) “එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව. නමුත් ආත්මයාණන් වහන්සේට කිය නොහැක කෙඳිරිගැසීම් වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක.”** (රෝම 8:26)

(2) පිඹීදීම උදෙසා කරන යාච්ඤාවන් යනු ලැජ්ජා සහගතව සිටින විටදී කරන යාච්ඤාවන්ය.

එස්රා ලැජ්ජා සහගතව මෙසේ යාච්ඤා කළේය. **“මාගේ දෙවියන් වහන්ස .., මම ලැජ්ජාවට පත්වී මාගේ දෙවි වූ ඔබ දෙසට මාගේ මුහුණ ඔසවන්ට විලිහියෙන් සිටිමි. මක්නිසාද අපේ අපරාධ අපේ ඉස්වලටත් උඩින් වැඩිවී අපේ වරදකාරකම ස්වර්ගය දක්වා නැගී තිබේ.” (එස්රා 9:6)** ඔහු ලැජ්ජා සහිත මුහුණකින් යුතුව පව් ගැන පාපොච්චාරණය කළෝය. එය වැරදි දේ පෙන්වාදීම සඳහා නිවැරදි සහයවීමකි. පසුතැවිලි වූ හදවතකින් පැමිණෙන යාච්ඤාව දෙවියන් වහන්සේගේ මහිමය සඳහා දැවෙන ජ්වලිතයක් සහ උන්වහන්සේට අගෞරව ඇති වී තිබීම ගැන ලැජ්ජාවෙන් යුතුව තිබේ. දෙවියන් වහන්සේ කිසි විටෙක එවැනි යාච්ඤාවන් පසුකර යන්නේ නැත.

(3) පිඹීදීම උදෙසා කරන යාච්ඤාවන් යනු මුහුණින් වැටී කරන යාච්ඤාවන්ය.

අධර්මිෂ්ඨකම දැකීම, බෙලහීනත්වය, ආකර්යක්ෂමතාවය සහ අදක්ෂකම පිළිබඳ දැනුවත්භාවය සහ දෙවියන් වහන්සේ මත යැපීම, අර්බුදවලදී ඇති විය හැකි අනතුරු ඇඟවීම දෙවියන් වහන්සේ ඉදිරියෙහි වැඳවැටීමට හේතුවේ. එය එකම සුදුසු ආකල්පයයි. අපගේ ස්වාමීන් වහන්සේ ගෙත්සෙමනේදී මෙසේ යාච්ඤා කළ **සේක. “උන්වහන්සේ වදක් ඉස්සරහට ගොස් මුහුණින් වැටී, අහෝ මාගේ පියාණෙනි, වේ කුසලාන මා කෙරෙන් පහවෙන්ට පුළුවන් නම් එසේ වේවා. එසේ වී නමුත් මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවායි කියා යාච්ඤා කළ සේක.”** (මතෙව් 26:39) මනුෂ්‍යයන්, දෙවියන් වහන්සේ ඉදිරියේ මුහුණින් වැටී සිටින විට පිඹීදීම ළංවේ.

4පිටුවට

3 පිටුවෙන්

පිඹිදීම ගෙන දෙන...

(4) පිඹිදීම උදෙසා කරන යාච්ඤාකිරීම පදනම්වන්නේ සමාවදීම මතය.

ඔවුන් ක්‍රිස්තුස් වහන්සේ නිමකරන ලද කාර්යයන් මත රැඳී සිටිති. පිඹිදීම උදෙසා කරන යාච්ඤාව ක්‍රිස්තුස් වහන්සේගේ මිදීම සපයා දෙන සේක. ඔවුන් කල්වාරියේ වරප්‍රසාද ඇයදින්නෝය. **"තමන්වහන්සේගේම පුත්‍රයා ඉතාඋකා නොගෙන අප සියල්ලන් උදෙසා පාවාදුන්නාවූ තැනැත්තවහන්සේ පුත්‍රයා අතුළුව අනිකුත් සියල්ල අපට නොදෙන්නේ කෙසේද ..? "** (රෝම 8:32) ක්‍රිස්තුස් වන්දි ගෙවීමේ පදනම මත අපි පැමිණෙන පිඹිදීම සඳහා යාච්ඤාවෙන් ජයගත යුතුය.

(5) පිඹිදීම උදෙසා කරන යාච්ඤාව ගිවිසුම මත පදනම්වේ.

අලුත් ගිවිසුම අවලංගු කළ නොහැකිය. එය වෙනස් කළ නොහැකිය. එබැවින් එහි නියමයන් සහ විධිවිධාන ගැන උනන්දුවක් දක්වන ශුද්ධවන්තයන්ට ස්වර්ගීය උසාවියේ පිඹිදීම සඳහා නීතිමය හිමිකම්පෑමට හැකිය. ඇදහිලිවන්තයන්ට අලුත් ගිවිසුමේ දී පිඹිදීමේ ආශිර්වාදයේ දොරටුවල රහස් යතුර ලබාදී තිබෙන සේක.

(6) පිඹිදීම උදෙසා කරන යාච්ඤාව එක්සත්ව කරන යාච්ඤාවකි.

පිඹිදීම සඳහා යාච්ඤා කිරීම තුළ එකමුතුකම සහ එකඟතාවය අත්‍යාවශ්‍යවේ අන්‍යෝන්‍ය යාච්ඤාවට පිළිතුරු වශයෙන් පිඹිදීම ලබාදෙන සේක. පුනරුදවාදීන් සහ ප්‍රතිසංස්කරණවාදීන් මෙම අවශ්‍යතාවය තේරුම් ගත්තෝය. එංගලන්තයේ නව පිඹිදීමේ පියා වන ජොනතන් එඩවඩ් පිඹිදීම උදෙසා දෙවියන් වහන්සේ ඉදිරියේ ආත්ම වේදනාවෙන් වැඳවැටුණි. ඔහු දෙවියන් වහන්සේගේ සෙනඟට කැඳවීමක් කළේය. දෙවියන් වහන්සේගේ ශුද්ධ ගිවිසුම්වලට සහ පොරොන්දුවලට අනුකූලව දේවස්ථානවල දෙවියන් වහන්සේගේ ක්‍රියාවන් පිඹිදීම ඇතිව කිරීම සඳහා යාච්ඤාවෙන් එකමුතුකමට සහ පැහැදිලි එකඟතාවයකට පැමිණීමට දේශය පුරා යාච්ඤා කණ්ඩායම් පිහිටුවීය. යාච්ඤාවේ ආත්මය සෙනඟ මත විය. ඔවුන් මුළු රාත්‍රියේම යාච්ඤාවේ යෙදුණෝය. "උදහස් වූ දෙවියන් වහන්සේගේ අතේ පව්කාරයෝ" යන ඔහුගේ ලෝක ප්‍රසිද්ධ දේශනාවට පෙර ඔහුගේ සභාව මුළු රාත්‍රියම මැදහත්කාරකමින් යාච්ඤා කළෝය.

අපිත් ආත්මයෙන් ප්‍රසව වේදනාව විඳිය යුතුය. දෙවියන් වහන්සේ ඉදිරියේ බිඳ වැටී සිටීමට අපට වඩා විශාල හේතුවක් තිබේ. කෙදිරිගෑමෙන් සහ බලවත් හැඩීමෙන් ස්වාමීන් වහන්සේව සෙවීමට කාලය මෙයයි. සභාව නින්දාවට පත්ව තිබේ. අභක්තිකයෝ නිර්භීතව සිටිති. බොහෝ යෞවනයන් උදාසීනය. දෙවියන් වහන්සේගේ සේවකයන් නින්දාවට පත්ව සිටිති. සතුරන් දේවස්ථානවලට සමච්චල් කරයි. අධර්මය පවතින්නේය. ඒ හා සමාන දුෂ්කර කාලවලදී දානියෙල් නිරාහාරව සිටීමෙන් හා කන්නලව් කිරීමෙන් ස්වාමීන් වහන්සේව සෙවීමට ඔහුගේ මුහුණ යොමු කළේය. අපි දෙවියන් වහන්සේ දෙස බලා සිටිය යුතුය. නිවෙස්වල ප්‍රසිද්ධ යාච්ඤා මෙහෙයන්වල බලවත් ලෙස යාච්ඤාවේ යෙදී සිටින විට දෙවියන් වහන්සේගේ අස්වභාවික අභිමුඛත්වයේ සහ බලයේ බලවත් ප්‍රකාශයක් අපි දකින්නෙමු. ආත්මයේ ප්‍රසව වේදනාව සමඟ වර්ධනයවීම අපි දකින්නෙමු.

(7) පිඹිදීම උදෙසා යාච්ඤා කිරීම යනු පරාර්ථකාමීව යාච්ඤා කිරීමයි.

ඔවුන් සොයන්නේ දෙවියන් වහන්සේගේ මහිමය, දේවස්ථානයේ සහ ලෝකයේ යහපත පමණි. ප්‍රේමය තමන්ගේම දේ සොයන්නේ නැත. ඔවුන්ගේ සෙනඟව ගලවා ගැනීම සඳහා මෝසෙස් සහ පාවුල් තමන්ව දෙවියන් වහන්සේගේ පොතෙන් මකා දැමීමට පවා ඔවුන් කැමති වූහ. (නික්මයාම 32:32, රෝම 9:3) අපට ද මෙලෙස පැවසිය හැකිය **"ස්වාමීනී, අපට නොව, අපට නොව, ඔබගේ කරුණාව නිසාත්, සැබෑකම නිසාත් ඔබගේ නාමයට ගෞරවය දුන මැනව."** (ගීතාවලිය 115:1) අපගේ යාච්ඤාවන් මේ ආකාරද...?

අතීතයේ මනුෂ්‍යයන්ගේ ඵලදායි පිඹිදීමේ යාච්ඤාවලට සම්බන්ධ සුවිශේෂී ලක්ෂණ එවැනි ඒවා විය. මෙම ගුණාංග අපගේ මැදිහත්වීම්වල දිස්වෙන ප්‍රමාණයට අනුව පිඹිදීම සඳහා අපගේ යාච්ඤාවන් ප්‍රතිඵලදායක වනු ඇත. මෝසෙස් කළාක් මෙන් අධ්‍යාත්මික සැලකිල්ල තුළ දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර සිටිමින් දැඩි වේදනාවකින් යුතුව යාච්ඤා කිරීමට අපව මෙහෙයවනු ලබයි. " ස්වාමීනී...., ඔබ වහන්සේ ආශිර්වාද ලබාදෙන තෙක්ම මම යන්නේ කෙසේදැයි නොදනිමි. " කරුණාවේ ආත්මය ශුද්ධවන්තයන්ගේ උද්යෝගීමත් යාච්ඤාවන් තුළ පවතින බව ප්‍රකාශ වේ. එවිට අපි මොරගසන්නෙමු. **"අපගේ දෙවි වූ ස්වාමීනී ...., ඔබගේ ශුද්ධ වූ නාමයට ස්තුති කරන පිණිසත්, ඔබට ප්‍රශංසා කිරීමෙන් ජයනාද පවත්වන පිණිසත් අප ගලවා ජාතීන් අතරෙන් රැස්කොට ගත මැනව"** (ගීතාවලිය 106:47)

තදින් ඉල්ලා සිටීම මත යාච්ඤාවේ රැඳී සිටින්න.

(ඊ.එම්. බවුන්ඩ්ස් විසිනි.)

මෙය ක්‍රිස්තුස් වහන්සේගේ යාච්ඤාවේ සැබෑ ලක්ෂණයක් ලෙස තබා තිබේ. අපි යාච්ඤා කළ යුතු බව පමණක් නොව නමුත් මහත් අවශ්‍යතාවයක් ඇතිව, බලාපොරොත්තු සහිතව සහ පුන පුනා කියමින් යාච්ඤා කළ යුතුය. අපි යාච්ඤා කළ යුතුව තිබෙනවා පමණක් නොව නැවත නැවතත් යාච්ඤා කළ යුතුය. අපි යාච්ඤා කිරීමෙන් වෙහෙසට පත් නොවිය යුතුය. යාච්ඤාවේ රහස සහ එහි සාර්ථකත්වය, එහි අත්‍යාවශ්‍ය බව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉතා පැහැදිලිව පෙන්වා දුන් නිසා අපි ඉතා ඕනෑකමින් අපි ඉල්ලන දේවල් ගැන ගැඹුරින් සැලකිලිමත් විය යුතුය. අපි අපගේ යාච්ඤාවෙන් දෙවියන් වහන්සේට ආයාචනා කළ යුතුය.

මනුෂ්‍යයෙක් සරලව නොව මුළු හදවතින්ම යාච්ඤා කළ යුතු බවත්, ප්‍රබල ශක්තියකින් හා නිර්භීත හදවත්වලින් එම කාරණයට මුහුණ දිය යුතු බවත්, පෙන්වා දෙන පිණිස අපගේ ස්වාමීන් වහන්සේ උපමාවකින් සියුම් ලෙස ඉගැන්වූ සේක. **"තවද ඔවුන් විසින් නොවැලිව නිතර යාච්ඤා කරන්ට ඕනෑ බව දක්වන පිණිස උන්වහන්සේ ඔවුන්ට උපමාවක් කියන සේක්"** දෙවියන් වහන්සේට බය නැත්තා වූ මනුෂ්‍යයන්ට ගරු නොකළා වූ විනිශ්චකාරයෙක් එක් නුවරක සිටියේය. ඒ නුවර වැන්දඹුවක් ද සිටියාය. ඈ නොයෙක් වර ඔහු ළඟට ගොස් වගේ විරුද්ධකාරයා ගැන මට යුක්තිය කළ මැනවයි කීවාය. ඔහු කලක් නොකැමති විය. පසුව ඔහු තමා තුළ කථාකොට මම දෙවියන් වහන්සේට බය නොවෙමි. නමුත් මනුෂ්‍යයාට ගරු නොකරමි නමුත් මේ වැන්දඹුව මට කරදර කරන හෙයින් ඈ නිතර රිංවෙන් මා නොපැකිළෙන පිණිස ඈට යුක්තිය කරන්නෙමියි කී සේක. එවිට ස්වාමීන් වහන්සේ කියන සේක් මේ අධර්මිෂ්ඨ විනිශ්චකාරයා කියන දේ අසාපල්ලා. දෙවියන් වහන්සේත් තමන්ට රෑ දාවල් හඬගසන්නා වූ තමන් තෝරාගත්තවුන් ගැන යුක්තිය ඉෂ්ඨ නොකරන සේක්ද .....? උන්වහන්සේ ඔවුන් කෙරෙහි බොහෝ ඉවසිල්ලෙන් සිටින සේක. උන්වහන්සේ ඔවුන්ට වහාම යුක්තිය ඉෂ්ඨ කරන සේකැයි නුඹලාට කියමි. එසේ වීනමුත් මනුෂ්‍ය පුත්‍රයා එන කල්හී පොළොවේ ඇදහිල්ල සම්බවේදැයි කී සේක." (ලූක් 18:1-8)

බලාපොරොත්තු රහිත බවට මුහුණදීම

මේ දිළිඳු කාන්තාවගේ සිද්ධිය ඉතාමත් බලාපොරොත්තු රහිත එකක් විය. නමුත් ආයාචනා කිරීම බලාපොරොත්තු නොමැති කාරණා වලට බලාපොරොත්තුවක් ගෙනදෙන අතර සාර්ථකත්වය හෝ කොන්දේසි රහිත සාර්ථකත්වය ගෙනදෙයි. අන් සියල්ල අසාර්ථක වූ විට වෙහෙස නොබලා උත්සහවන්තව ආයාචනා කිරීම තුලින් අවසානයේදී ජයග්‍රහණය ලබාගන්නේ කෙසේදැයි පෙන්වීමට ඊටවඩා වෙනත් ශක්තිමත් අවස්ථාවක් තිබිය නොහැකිය. මෙම උපමාව ආරම්භයේදී මෙසේ සඳහන් වේ. **"තවද ඔවුන් විසින් නොවැලිව නිතර යාච්ඤා කරන්ට ඕනෑ බව දක්වන පිණිස උන්වහන්සේ ඔවුන්ට උපමාවක් කියන සේක."** (ලූක් 18:1) යාච්ඤා කිරීමේදී මනුෂ්‍යයන් ඉක්මනින් ක්ලාන්ත වන බව යේසුස් වහන්සේ දැනගෙන සිටි අතර එම නිසා උන්වහන්සේ අපව ධෛර්යයමත් කිරීමට මෙම පුදුමුකාර උපමාව ලබාදුන් සේක.

මෙම වැන්දඹුව දුර්වල සහ බලාපොරොත්තු රහිතව සිටියාය. අසරණ සහ බලපෑමක් ඇති කළ නොහැකි ඇය අසාධාරණ විනිශ්චකාරයෙකුව ක්‍රියාකාරී කරවමින් ඇය තවමත් ඇගේ නඩුව ජයගන්නේ ඇගේ වෙහෙස නොබලා සහ ආයාචනා කිරීමේ වැදගත්කම මගිනි. ආයාචනා කිරීමේ අවශ්‍යතාවය එහි බලය සහ යාච්ඤා කිරීමේ අතිමහත් වැදගත්කම ගැඹුරු හෝ වඩාත් ආකර්ෂණීය වර්ණ ගැන්වීමකින් නිරූපනය කළ හැකිද ..? එය සියලු බාධක අභිබවා යන අතර එසේ නොමැති නම් සියලු බාධක ඉවත් කර දමයි. සෑම විරුද්ධවාදී බලයක්ම පරාජය කර ජයග්‍රහණ කරනු ලබයි. යාච්ඤාවෙන් තොරව අපට කිසිවක් කළ නොහැකිය. සියලු දේ කළ හැකිවන්නේ ආනුභාසම්පන්න යාච්ඤා කිරීම තුලිනි. එය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීමයි.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වදාළ තවත් උපමාවක් ද මෙම උතුම් වූ සත්‍යතාවය පහදා දෙනු ලබයි. මධ්‍යම රාත්‍රියේ මනුෂ්‍යයෙක් තම නිවසට පැමිණි ආගන්තුකයෙකුට දීම සඳහා රොටී ණයට ඉල්ලා ගැනීමට තම මිතුරෙකු වෙතට යයි. ඔහුගේ ආයාචනය මිත්‍රත්ව මත පදනම්ව ශක්තිමත්ව තිබේ. නමුත් මේ සියල්ල අසාර්ථකවේ. ඔහුට රොටී නොලැබේ. නමුත් ඔහු රැඳී සිට නොකඩවා ආයාචනා කිරීමෙන් ඔහුට ප්‍රතිඵල ලැබේ. අනෙකුත් සියලු බලපෑම් ඉල්ලීම් අසාර්ථක වූ විට නොසැලී ආයාචනා කිරීම තුළ සාර්ථක වේ.

ශිරෝපිනීෂියානු කාන්තාවගේ උපමාවේදී ඇගේ කාරණා ඉටුවේ. ඇය ක්‍රිස්තුස් වහන්සේ වෙතට එළඹුණ ආකාරයට වෙන කිසිවෙක් ක්‍රියා නොකළ බව සඳහන් තොරතුරු මගින් පැහැදිලි වේ. මුලින් ඇයව ප්‍රතික්ෂේප කරනු ලැබීය. පසුව ඇය කරුණු පැහැදිලි කරමින් බලපෑමක් ඇති කළාය. දෙවියන් වහන්සේ තම සෙනඟ වන ඊශ්‍රායෙල් වංශය වෙත සේවය කිරීමට යේසුස් වහන්සේව එවා තිබෙන

5 පිටුවට

4පිටුවෙන්

තදින් ඉල්ලා සිටීම මත...

බව ප්‍රකාශ කළ අතර බල්ලන් ලෙස ඇගේ වංශය නින්දාවට ලක්කරනු ලැබීය. එහෙත් ඇය සියල්ල පිළිගෙන සියල්ල ජයගනු ලැබීය. ඇගේ යටහත්වීමෙන්, උත්සහවන්තකමෙන්, පරාජය කළ නොහැකි ආයාචනා කිරීමෙන් සියල්ල ජයගත්තේය. ඇයගේ ක්‍රියාව ගැන දිව්‍ය පුත්‍රයා සතුටු ව ඇයට මෙසේ පැවසූ සේක. **."... ස්ත්‍රිය නුඹේ ඇදහිල්ල මහත්ය. නුඹේ කැමැත්ත ලෙසම නුඹට වේවායි කී සේක. ඒ පැයේ පටන් ඇගේ දුව සුවපත් වූවාය."** (මතෙව් 15:28) මහත් ඇදහිල්ලෙන් යුතුව කළා වූ අයාචානය තුළ යේසුස් වහන්සේ පිළිතුරු ලබාදුන් සේක.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ යාච්ඤාවේ ප්‍රධාන කොන්දේසි වලින් එකක් වන යාච්ඤාවේ එක් අංගයක් ලෙස ආයාචනා කිරීමේ හැකියාව තබා තිබෙන සේක. ශිරෝෂිනීෂියානු කාන්තාවගේ යාච්ඤාව පැරණි ඔලිම්පික් ක්‍රීඩාවල පොරබැදීම්වලදී පෙනෙන ශක්තියට වඩා ශක්තියක් විඳදරා ගැනීමක් සහ සියලු උසස් අංගයන් සම්බන්ධව වඩාත් බලයේ ප්‍රදර්ශනයක් ප්‍රකාශ කරනු ලබයි.

යේසුස් වහන්සේ ආයාචනා කිරීම පිළිබඳ පළමුවෙනි පාඩම කන්ද උඩ දේශනාවේ දී ඉගැන්වූ සේක. **"ඉල්ලාපල්ලා එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා එවිට නුඹලාට සම්බවේ. තට්ටුකරපල්ලා එවිට නුඹලාට දොර හරිනු ලැබේ. වක්නිසාද ඉල්ලන්නා වූ සියල්ලට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටු කරන්නාට දොර හරිනු ලැබේ."** (මතෙව් 7:7-8) අඛණ්ඩව යාච්ඤා නොකර පිළිතුරු ලබාගත නොහැකිය. ආයාචනා කිරීම සෑදී ඇත්තේ අල්ලාගෙන සිටීම, ලිහිල් නොවන සහ ලිහිල් කළ නොහැකි ග්‍රහණයෙන් යුතුව බලාසිටීමේ හැකියාව, විවේක නොගන්නා වූ ආශාව සහ විවේකී ඉවසීම තුලින්ය. ආයාචනා කරමින් යාච්ඤා කිරීම යම් සිදුවීමක් නොවේ. නමුත් එය ප්‍රධාන කාර්යයයි. එය යම් කාර්යයයක් ඉටු කිරීමක් නොව දැඩි ආශාවෙන් යුතු උද්යෝගයයි. එය අවශ්‍යතාවයක් නොව නමුත් අත්‍යාවශ්‍යව තිබෙන දෙයයි. යාච්ඤාව එහි උච්චතම ස්වරූපයෙන් සහ අතිවිශිෂ්ඨ සාර්ථකත්වය දෙවියන් වහන්සේ සමඟ පොරබැදීමක ආකල්පය උපකල්පනය කරයි. එය ඇදහිල්ලේ තරඟය, පරීක්ෂණය සහ ජයග්‍රහණයයි. දෙවියන් වහන්සේ එයින් අපගේ ඇදිහිල්ල විශාල කරන සේක. අපගේ ශක්තිය සෝදිසි කිරීමෙන් අපව ශක්තිමත් කරන සේක. එයින් එයින් අත්දැකීමක්, යුගයක්, ආත්මය සඳහා තව දින දර්ශනයක් , නව ආත්මික ජීවිතයක් සඳහා සොල්දාදුවෙක්ව පුහුණු කරනු ලබයි.

උද්යෝගී බව, නොපමාව, දැඩි ආශාව ඇති බව

දුර්වල ආශාවන්, උදාසීන උත්සාහයන්, කම්මැලි ආකල්ප සඳහා බයිබලයේ දිරිගැන්වීමක් හෝ ඉඩක් ලබාදෙන්නේ නැත. සියල්ල උද්යෝගී නොපමාව ඉටුකරන, දැඩි ආශාව ඇති ඒවා විය යුතුය. ඇවිළුණු ආත්මික ආශාවන්, උද්යෝගිමත්ව, වෙහෙස නොබලා බලපෑමක් ඇති කිරීම ස්වර්ගය සතුටු කරයි. දෙවියන් වහන්සේ තම දරුවන්ව ඉතා උනන්දුවෙන් නොපසුබට උත්සාහයෙන් සහ නිර්භීතව තබන සේක. උද්යෝගිමත් නොවූ හෝ හදිස්සියේ (ඉඳහිට) කරන යාච්ඤාවලට ස්වර්ග යෙන් පිළිතුරු ලබා ගැනීමට නොහැකිය. අපේ මුළු පැවැත්මම යාච්ඤාවේ තිබිය යුතුය. මට ස්කොට්ලන්තය දෙන්න නැතිනම් මට මරණය දෙන්න කියා ජේන් නොක්ස් පැවසුවේය. අපෙග් මිල අධික පරිත්‍යාගයෙන්, අපගේ මිල අධික ගැටුම්වලින්, අපගේ මිල අධික යාච්ඤාවෙන් අපගේ අත්දැකීම් හා දෙවියන් වහන්සේගේ හෙළිදරව් කිරීම් උපත ලබයි. මුළු රාත්‍රියේම පොර බදිමින් යාකොබ් කළ යාච්ඤාව ඔහුගේ ජීවිතයේ කිසිදාක අමතක නොවන යුගයක් බවට පත්කළේය. ඔහු දෙවියන් වහන්සේව අල්ලා ගත්තේය. යාච්ඤාව තුළින් ඒසව්ගේ ආකල්ප සහ හැසිරීම් වෙනස් කළේය. යාකොබ්ගේ චරිතය ද වෙනස් කළේය. ඔහුගේ ජීවිතය බේරා ගැනීමට බලපෑවේය. ජාතියක පුරුදුවලට එය ඇතුළත් විය.

අපගේ ආත්මික යාච්ඤා කාලයන් දියමන්තියක් මෙන් අපගේ දුෂ්කරම තැන්වලට දමා අපගේ චරිතය නොමැකෙන සලකුණු වලින් සලකුණු කරනු ලබයි. ඒවා අපගේ ජීවිතයේ කැපී පෙනෙන කාල පරිච්ඡේද අප විඳදරා ගන්නා සහ අප හැරෙන ස්මාරක වන්නේය. එහි වැදගත්කම වන්නේ එය නැවත නැවතත් කළ හැකිය. අපි කාරණා අවධාරණය කළ යුත්තේ නිශ්ඵල ලෙස නොව නෙපමාව එය ඉටු කළ යුතුය. අපි නැවත නැවතත් කාලය ගණන් කිරීමට නොව යාච්ඤාවෙන් ජය ගැනීමට යොමු වෙමු. අපට යාච්ඤා කිරීම නතර කළ නොහැකිය. අපගේ මුළු හදවතින් සහ මුළු උත්සාහයෙන් යාච්ඤා කරමු. අපි අපගේ යාච්ඤා කිරීමෙහි එල්ලී සිටින්නේ අපි ජීවත්වන්නේ එයින් බැවිනි. යාච්ඤා කිරීමේ වැදගත්කමේ අවශ්‍යතාව අපට අවධාරණය කරන පිණිස යේසුස් වහන්සේ උපමා දෙකක් ලබා දුන් සේක.

එමෙන්ම යෝවාෂ්ට සම්පූර්ණ ජයග්‍රහණය ලබා ගැනීමට නොහැකි වූයේ ඔහු තම දඩයම නතර කළ නිසා බව අපි දනිමු. (2 රාජාවලිය 13:18-19) දෙවියන් වහන්සේ සමඟ මෙන්ම මනුෂ්‍යයා සමඟද නොපසුබට උත්සාහය ඉතා වැදගත් වේ. එළියා පළමු අවස්ථාවේදී ඔහුගේ ඉල්ලීම නතර කළේ නම් වර්ෂාව ලබා දෙන්නේ නැති තරම්ය. (1 රාජවලිය 18:42-45) යාකොබ් රාත්‍රියේ නින්දට යන වේලාවේදී යාච්ඤා කිරීම නතර කළා නම් ඊළඟ දවසේදී ඒසව්ව මුණ ගැසෙන විට යාකොබ්ට බේරී යාමට නොහැකි වනු ඇත. (උත්පත්ති 32:24-30) ශිරෝපිනීෂියානු කාන්තාව නිශ්ශබ්දතාවයෙන් නින්දාවෙන්, පිළිකුලෙන් හෝ අතරමඟ නතර කිරීමෙන් ඇගේ ඇදහිල්ල ක්ලාන්තවීමට ඉඩ දුන්නේ නම් ශෝකයෙන් පෙළෙන ඇගේ නිවාස කිසි විටෙකත් ඇගේ දියණියගේ සුවයෙන් දීප්තිමත් නොවනු ඇත.

යාච්ඤා කරන්න ....., කිසිවිටෙකත් ක්ලාන්ත නොවන්න.

යාච්ඤා කරන්න. කිසිවිටෙකත් ක්ලාන්ත නොවන්න. යන්න ක්‍රිස්තුස් වහන්සේ අපට යාච්ඤා කිරීම සඳහා දෙන ආදර්ශ පාඨයයි. එය අපගේ ඇදහිල්ලේ පරීක්ෂණයක් වන අතර පරීක්ෂාව වඩාත් දරුණු වන තරමට සහ බලාපොරොත්තුව දිගුවන තරමට ප්‍රතිඵලය වඩාත් තේජාන්විත වේ. ආයාචනා කිරීමේ ප්‍රතිලාභ සහ අවශ්‍යතාවය පරණ ගිවිසුමේ ශුද්ධවන්තයන් විසින් අපට උගන්වන්නේය. යාච්ඤා කරන මනුෂ්‍යයන් බලාපොරොත්තුවෙන් ශක්තිමත් වී ඇදහිල්ලෙන් යාච්ඤා කළ යුතුය. බලාසිටින්නේ තදින් ඉල්ලා සිටින්නේ සහ උද්යෝගයෙන් දෙවියන් වහන්සේ වෙතට සමීප වන්නේ කෙසේදැයි ඔවුන් දැන සිටිති.

මෝසෙස් දවල් සතලිහක් සහ රාත්‍රී සතලිහක් නිරාහාරව යාච්ඤාවෙන් ඊශ්‍රායෙල් වෙනුවෙන් මැදිහත් වූ විට ආයාචනා කිරීමේ බලය ඉගැන්විය. එමෙන්ම ඔහු තමාගේ අයැද සිටීම සාර්ථක කරගත්තෝය. යේසුස් වහන්සේ, උන්වහන්සේගේ ඉගැන්වීමේදී සහ ආදර්ශයේ දී පරණ ගිවිසුමේ ආයාචනා කිරීමේ සහ බලාසිටීමේ මෙම නිදර්ශනය සම්පූර්ණ කළේය. තම පියාණන් වහන්සේගේ මෙහෙවර සඳහා කෙලින්ම පැමිණි දෙවියන් වහන්සේගේ එකම පුත්‍රයා කොයිතරම් අපූරුද .. ? පොළොවට පැමිණි එකම ස්වර්ගීය තැනැත්තා වහන්සේ උන්වහන්සේගේ ජීවිතය සහ පියාණන් වහන්සේගේ කැමැත්ත තුළ සේවය ඉටුකිරීමේ නියමය යාච්ඤා කිරීමතුළ තැබූ සේක. යාච්ඤා කිරීම කරුණුකොටගෙන ආශිර්වාද පැමිණීම තදින් අල්ලා ගැනීම සහ කාවැද්දීම කොයිතරම් අභිරහසක්ද ... ? යාච්ඤා කිරීම තුළ ආයාචනා කිරීම ඉලක්ක කර ගැනීම කරුණුකොටගෙන දෙවියන් වහන්සේගේ ආශිර්වාදයේ සැපයීම ලබාගත් සේක. උන්වහන්සේ සුදුසු ලෙස යාච්ඤා නොකළ සේක් නම් උන්වහන්සේගේ ඉතිහාසය තුළ කිසිදු වෙනක් සිදු නොවනු ඇත. උන්වහන්සේගේ බලවත් වූ දිව්‍යමය කාර්යයන් කිසිවක් සිදු නොවනු ඇත. උන්වහන්සේ මුළු රාත්‍රිය පුරාවටම යාච්ඤා කළ අතර උන්වහන්සේගේ මුළුදවස පුරාවටම කරන ලද ක්‍රියාවන අනුකම්පාවෙන් සහ බලයෙන් පූර්ණ එකක් විය. උන්වහන්සේගේ යාච්ඤාව උන්වහන්සේගේ ජීවිතයට ඔටුන්නක් බදු විය. උන්වහන්සේගේ මරණය ජයග්‍රහණයට පමුණුවනු ලැබූ සේක. යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීමේ පාඩම ඉගෙන ගත්තේ කුරුසියේ ඉතා මහත් යටහත්වීමට පෙර අයාචනා කිරීමේ යාච්ඤාවේ පොරබැදීමේදීය.

චාර්ල්ස් ස්පර්ජන් පැවසුවේ අපි කැමතිවුවත් නැතත් ඉල්ලීම දේවරාජ්‍යයේ නීතිය බවයි. "ඉල්ලාපල්ලා එවිට නුඹලාට දෙනු ලැබේ." එය කිසි විටෙකත් කිසිදු ආකාරයකින් වෙනස් නොවන රීතියකි. අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පවුලේ වැඩිමහල් සහෝදරයා වන නමුත් දෙවියන් වහන්සේ උන්වහන්සේ උදෙසා නීතිය ලිහිල් කර නැත.. පියාණන් වහන්සේ තමන් වහන්සේගේ පුත්‍රයාණන්ට මෙසේ පවසන සේක. **"මාගෙන් ඉල්ලව, එවිට නුඹේ උරුමයට ජාතීන් ද නුඹේ කොටසට පොළොවේ සීමාන්තය දක්වා දෙන්නෙමි."** (ගීතාවලිය 2:8) රාජකීය හා දිව්‍ය පුත්‍රයාණන්ව ඉල්ලා සිටීමේ රීතියෙන් නිදහස් කර නැතිනම් ඔබටත්, මටත් එම නීතිය අපට වාසිදායක ලෙස ලිහිල් කරනු ඇතැයි අපේක්ෂා කළනොහැකිය. එය විය යුත්තේ ඇයි ... ? යාච්ඤා කිරීමෙන් අපව නිදහස් කළ යුත්තේ ඇයි කියා කියන හේතුව කුමක්ද .. ? අපට වරප්‍රසාද අහිමි කර කන්නලව් කිරීමේ අවශ්‍යතාවයෙන් මිදිය යුත්තේ ඇයි කියා තර්කයක් තිබිය හැකිද .. ? මට නම් කිසිදු තර්කයක් පෙනෙන්නට නැත. ඔබටත් එසේද ... ?

දෙවියන් වහන්සේ එළියාට ආශිර්වාද කොට ඊශ්‍රායෙල් දේශයට වැස්ස එවනු ඇත. නමුත් ඒ සඳහා එළියා යාච්ඤා කළ යුතු විය. තෝරාගත් ජාතිය සමෘද්ධිමත් වීමට නම් සාමුවෙල් ඒ වෙනුවෙන් අයැද සිටිය යුතු විය. (1 සාමුවෙල් 7:3:13) යුදෙව්වන්ව ගලවා ගැනීමට නම් දානියෙල් මැදහත් විය යුතු විය. දෙවියන් වහන්සේ පාවුල්ට ආශිර්වාද කළ සේක. නමුත් ජාතීන් ඔහු තුලින් හරවා ගැනීමට නම් ඔහු යාච්ඤා කළ යුතු විය. ඔහුගේ ලිපි වලින් පෙන්නුම් කරන්නේ ඔහු එය ඉල්ලා එවීම හැර වෙන දෙයක් අපේක්ෂා නොකළ බවයි. ඔබට තිබෙන සියල්ල ඉල්ලීමෙන් ලැබී තිබේ නම්, ඉල්ලන්නේ නැතිව කිසිවක් ලැබෙන්නේ නැත. එයින් යාච්ඤා කිරීම කොයිතරම් අත්‍යාවශ්‍යදැයි බැලීමට මම ඔබගෙන් ඉල්ලා සිටිමි.

නොපසුබස්නා උත්සාහයක් නොමැතිකම නිසා අපගේ යාච්ඤාවන් බොහෝමයක් අසාර්ථක වන බවට සැකයක් නැත. එහි නොපසුබට උත්සාහයේ ගින්න සහ ශක්තිය නොමැති වේ. නොපසුබට උත්සාහ සැබෑ යාච්ඤාවේ හරයයි. එබැවින් එහි පැවතිය යුතුය. යේසුස් වහන්සේ ඉගැන්වූයේ නොපසුබස්නා උත්සාහය යාච්ඤාවේදී අත්‍යාවශ්‍ය අංගයක් බවයි. දෙවියන් වහන්සේගේ පාපුටුව ළඟ දණින් වැටෙන විට මනුෂ්‍යයන් උනන්දුවෙන් සිටිනු ඇත.

බොහෝ විට අප ක්ලාන්ත වී යාච්ඤා කිරීම ආරම්භ කරන ස්ථානයේදීම නතර කරන්නෙමු. අපගේ යාච්ඤාවන් දුර්වල වන්නේ ඒවා නොවරදින සහ ප්‍රතිරෝධී කැමැත්තකින් උද්වේගකර නොවන බැවිනි. දෙවියන් වහන්සේ, ආයාචනා කරන අයට ප්‍රේම කරන අතර ඔහුට කිසිදාක ලබානොදෙන පිළිතුරු ලබාදෙනු ලබයි. නමුත් ආශා කරන ලද ඉල්ලීම් ලබාදෙන තුරු අඛණ්ඩව පැවතීම සඳහා ප්‍රතික්ෂේප කිරීම අත්හැරිය යුතුය.

විශ්වාස කිරීමට සහ යාච්ඤා කිරීමට දිරිගැන්වීම

“මක්නිසාද සෙනඟ සියොන්හී යෙරුසලමේ වාසය කරන්නෙහ්ය. නුඹ තවත් අඬන්නේ නැත. උන්වහන්සේ නුඹේ මොරගැසීමේ හඬට නුඹට දයාවෙනවාම ඇත. ඇසුණු කෙනෙහිම උන්වහන්සේ නුඹට උත්තර දෙනවා ඇත.” (යොසායා 30:19)

“උන්වහන්සේ නුඹට දයා වෙනවාම ඇත.” මෙම සහතිකයේ පදනම කුමක්ද .. ? අපගේ සැනසිල්ලේ පදනම මෙම පදයේ දක්වා ඇති පරිදි දෙවියන් වහන්සේගේ පොරොන්දුව ශුද්ධ ලියවිල්ල පුරා විසිරී ඇති බොහෝ සමාන ප්‍රකාශයන් තුළ දක්නට ලැබෙන බව ප්‍රථමයෙන්ම මම බට ප්‍රකාශ කරමි. අපි දෙවියන් වහන්සේ වෙතට හැරී උන්වහන්සේව විශ්වාස කළ යුත්තේ මන්දැයි ඔබ දැන ගැනීම අවශ්‍යවේ. එනම් තමන් වහන්සේගේ වචනය බොරු කිරීමට හෝ වෙනස් කිරීමට නොහැකි ස්වාමීන් වහන්සේ මෙසේ පවසන සේක. ... **“නුඹ තවත් අඬන්නේ නැත. උන්වහන්සේ නුඹේ මොරගැසීමේ හඬට දයාවෙනවාම ඇත. ඇසුණු කෙනෙහිම උන්වහන්සේ නුඹට උත්තර දෙනවා ඇත.”** (යොසායා 30:19) මෙය උන්වහන්සේගේ නොවරදින වචනයේ කොටසක් නේද .. ? එන්න, එසේ නම් ඔබගේ බයිබලය විවෘත කර ඔබගේ ඇදහිල්ල මෙම වචනය මත තබා මෙලෙස පවසන්න. දෙවියන් වහන්සේ මට ඉතා දයාවන්තව සහ මාගේ යාච්ඤාව ඇසීමට උන්වහන්සේ සූදානම් බව ප්‍රකාශ කරන බව මම ප්‍රකාශ කරමි. මීට වඩා ඔබට අවශ්‍ය වන්නේ කුමක්ද .. ? දරුවෙකුට තම පියාගේ වචනයට වඩා හොඳ සහතිකයක් අවශ්‍යද .. ? සැබෑ ගෝලයෙකු තම ස්වාමියාගේ පොරොන්දුවට වඩා ප්‍රබල සාක්ෂියක් අසයිද ... ? එය ලියා තිබේ. එයට ඔබට ප්‍රමාණවත් නොවේද ..? ඔබ දණින් වැටී මෙම වචනය මත ආයාචනා කරන්න.

ඔබේ මිතුරා විසින් මම ඔබේ ඉල්ලීම ඉටුකරන්නෙමි කියා කීවා නම් ඔබ එය විශ්වාස කරන්නේ නැද්ද .. ? එසේ නම් ඔබේ දෙවියන් වහන්සේ වන ස්වර්ගීය පියාණන් වහන්සේ ගැන සැක නොකරන්න. උන්වහන්සේගේ වචනය අවිශ්වාස කිරීමට දෙවියන් වහ්නසේ කිසි විටෙකත් ඔබට හේතුවක් දී නොමැත. උන්වහන්සේගේ පොරොන්දු සියල්ල විශ්වාසවන්ත නොවේද ... ? එන්න, උන්වහන්සේගේ සහතිකය ඉතා හොඳ පදනමකි. මෙවැනි එක් පොරොන්දුවක් තිබුණා නම් ප්‍රමාණවත් වේ. නමුත් එවැනි පොරොන්දු කීයක් තිබෙනවාදැයි බලන්න. දෙවියන් වහන්සේගේ කරුණාවන්ත වූ පොරොන්දු රාත්‍රියේ අහසේ දිස්වෙන තරු මෙන්ය. මම ඒවා උපුටා දැක්වීමට අවශ්‍ය නැත. මක්නිසාද ඔබ ඒවා හොඳින් දන්නා අතර පොරොන්දුවල සංඛ්‍යාව ඉතා විශාලය. නමුත් ඒවා ඇදහිල්ල තුළ සිදුවන අතර අවිශ්වාසය තුළ එයින් කිසිවක් ඉටු නොවේ. ඔබ ඔබේ දෙවියන් වහන්සේගේ එම පොරොන්දු කෙරෙහි විශ්වාසය තබන්න. එවිට උන්වහන්සේගේ වචනය ඔබේ ප්‍රීතිමත් අත්දැකීම වනු ඇත.

දෙවියන් වහන්සේගේ කරුණාවන්ත ස්වභාවය

මෙම සහතිකය ගොඩ නගා ඇති දෙවන පදනම වන්නේ දෙවියන් වහන්සේගේ කරුණාවන්ත ස්වභාවයයි. අප අවධානය යොමු කරන බයිබල් පදය දෙස නැවත බලන්න. “උන්වහන්සේ නුඹට දයාවනවාම ඇත.” ... ඊශ්‍රායෙල්ගේ දෙවියන් වහන්සේ වන ස්වාමීන් වහන්සේගේ ස්වභාවය නම් උන්වහ්නසේ ඉතා දයාවන්තව ක්‍රියා කරන සේක. උන්වහන්සේ තම අත දිගුකර සෑම ජීවමාන දෙයකටම අවශ්‍ය දේ සපයා දෙන සේක. උන්වහන්සේ දයාවේ දෙවියන් වහන්සේ වන සේක. උන්වහන්සේ තම මැවිල්ල වන පාපයට ගොදුරු වූ මුළු මැවිල්ල ගැන අනුකම්පා කරන සේක. උන්වහන්සේ තම හදවතේ ප්‍රේමණීය පුත්‍රයාව පූජා කළ සේක. (රෝම 8:32) උන්වහන්සේ අපේ ජාතියේ වැරදිවලට අනුකම්පා කරන සේක. උන්වහන්සේ මොනතරම් දයාවන්ත වූ දෙවියන් වහන්සේ ද කියා බලන්න.

උන්වහන්සේගේ ක්‍රියාව එතැනින් අවසන් වන්නේ ද නැත. උන්වහන්සේ සමාව දුන් අයට උන්වහන්සේගේ ප්‍රේමණීය කරුණාව ඉතා මහත්ව තිබේ. උන්වහන්සේගේ ප්‍රේමය ඉතා පුදුමයි. එය අගාධයකට වඩා ගැඹුරුය. අහසට වඩා උසස්ය. මුහුදට වඩා පුළුල්ය. දැන් ඔබට ඇති කරදරය කුමක්ද .. ? ඔබට උපකාර කිරීමට දයාවන්ත දෙවියන් වහන්සේ විශ්වාසවන්තව සිටින බව විශ්වාස කරන්න. ඔබගේ පසුබටවීම් මොනවාද .. ? ඔබව යථා තත්ත්වයට පත්කරන පිණිස ඔබේ දයාවන්ත දෙවියන් වහන්සේව විශ්වාස කරන්න. ඔබේ අපේක්ෂා කරන සෝදිසි කිරීම් මොනවා වුවත් ඔබව දරා ගැනීම සඳහා දෙවියන් වහන්සේ මත රැඳිසිටින්න. උන්වහන්සේ කෲර පාලකයෙක් නම් ඔබට උන්වහන්සේ වෙතින් පලා යා හැකිය. නමුත් උන්වහන්සේගේ දයාව සදාකාලයටම පවතින බැවින් උන්වහන්සේ වෙත හැරීම ඔබේ ප්‍රඥාවන්ත ක්‍රියාව වනු ඇත. එන්න, අපි සියලුදෙනා එක්ව මේ මොහොතේ ඇදහිල්ලේ ක්‍රියාවන් කරුණුකොටගෙන උන්වහන්සේ ඉදිරියට ගොස් උන්වහන්සේගේ පාමුල වැටී උන්වහන්සේ පෙණුනත් නැතත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ එළිදරව් කළ පරිදි විශ්වාස කරමු. එවිට අපි උන්වහන්සේ සමඟ සමාදානයෙන් සිටින්නෙමු.

ආදරය, කරුණාව සහ දයාවෙන් පිරුණු දෙවියන් වහන්සේගේ චරිත ගුණාංග වලින් උන්වහන්සේව සොයන අයට උන්වහන්සේ කරුණාව දක්වන බව නිශ්චිතව තිබේ. එබැවින් අපි සෑම කෙනෙක්ම එක විට උන්වහන්සේව සොයමු. අපි අවධානය යොමු කරන යෙසායා 30:19 වන පදයේ අදහස් කරන්නේ “උන්වහන්සේ දයාවන්තව සිටිනවා” කියා නොව “උන්වහන්සේ ඉතා දයාවන්තව සිටිනවා” කියාය. මෙසේ ප්‍රකාශ කර තිබෙන වචන වලින් කරුණාව අනර්ඝ ලෙස දක්වා තිබීම දැකීමට මම ප්‍රිය කරමි. ශුද්ධ ලියවිල්ලේ දෙවියන් වහන්සේගේ දයාව ගැන අපි නිතර කියවන විට එහි ශ්‍රේෂ්ඨත්වය, නිදහස් බව හෝ විශිෂ්ඨත්වය දක්වන ආකාරයෙන් යම් වචනයක් ඇති බව සිතීමෙන් මාගේ සිත ප්‍රබෝධමත් කරනු ලබයි. **“නුමුත් දෙවියන් වහන්සේ දයාවෙන් පොහොස්ව සිටින සේක් අපට ප්‍රේම කළා වූ තමන් වහන්සේගේ මහත් ප්‍රේමයෙන් අපගේ වරද කරුණු කොටගෙන අප මැරී සිටි කල්හි පවා ක්‍රිස්තුස් වහන්සේ සමඟ අප ජීවත් කර නුඹලා ගැලවී සිටින්නේ අනුග්‍රහයෙන්ය. උන්වහන්සේ සමඟ අප නැගැටුවා ක්‍රිස්තුස් වහන්සේ තුළ ස්වර්ගීය වූ ස්ථානවල උන්වහන්සේ සමඟ අප හිඳවූ සේක.”** (එපීස 2:4-6) **“ස්වාමීන් වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටින සේක. කෝපවීමට ප්‍රමාදය අතිශයින් කරුණාවන්තය.”** (ගීතාවලිය 103:8) **“මක්නිසාද ස්වාමීන් වහන්සේ යහපත්ය. උන්වහන්සේගේ කරුණාව සදාකාලේටද උන්වහන්සේගේ විශ්වාසකම සියලු පරම්පරාවලට ද පවත්නේය.”** (ගීතාවලිය 100:5) **“ඒ දයාබරකමෙන් අඳුරෙහිද මරණ සෙවණෙහිද සිටින්නන්ට එළිය දෙන පිණිසත් අපේ පාද සමාදාන මාර්ගයට පමුණුවන පිණිසත්, ඉහළින් අරුණාලෝකය අප කරා පහළවන්නේ යයි කීයේය. ”(ලූක් 1:78-79) “ස්වාමීන්ට ස්තුති කරව. මක්නිසාද උන්වහන්සේ යහපත්ය. උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.”** (ගීතාවලිය 107:1) **“ මක්නිසාද අප කෙරෙහි උන්වහන්සේගේ කරුණාව මහත්ය. ස්වාමීන්ගේ සැබෑකම සදාකාලයට පත්නේය. ස්වාමීන්ට ප්‍රශංසා කරව.”** (ගීතාවලිය 117:2) **“දෙවියන් වහන්ස, ඔබගේ කරුණාගුණය ලෙස මට දයාවුව මැනව, ඔබගේ අධික දයාබරකම ලෙස මාගේ අපරාධ මැකුව මැනව.”** (ගීතාවලිය 51:1) දෙවියන් වහන්සේගේ දයාව සඳහන් කිරීම සමඟ පවතින වචන කොයිරතම් විශිෂ්ඨ ද කියා බලන්න.

දෙවියන් වහන්සේ ඉතා දයාවන්තව සිටින සේක. ඔබට විශේෂ වූ සැනසිල්ලක් අවශ්‍යද .. ? ඔබට එය ලැබෙනු ඇත. ඔබට විශාල උපකාරයක් අවශ්‍යද .. ? ඔබට එය ලැබෙනු ඇත. පව්කරුවන් උන්වහන්සේ වෙතට හැරී එන්න. උන්වහන්සේ සමාවදීමට බලා සිටින සේක. දැඩි ලෙස පීඩාවට පත් වූ තැනැත්තෙනි ඇවිත් මේ මහත් වූ සැනසීම

(චාර්ල්ස් එච්. ස්පර්ජන් විසින්) (1834 -1892)

ලබාගන්න. වෙහෙසට පත්ව ඉබාගාතේ යන ඇවිත් සම්පූර්ණ නිදහස අත්විඳින්න. දිළිඳු සහ අසරණ අය පැමිණෙන්න. උන්වහන්සේ ඔබට සියලු දේ සපයා දෙන සේක.

මෙහි ආදරයේ හා දයාවේ ගංගා ...
අනගි සාගරයක් තුළ එකතු වේ .....,
කිරි සහ මිදි යුෂ ගං වතුර මෙන් ....
ගැලවීම බහුල ලෙස ගලා යයි

දේව වචනයේ සහතිකය දෙවියන් වහන්සේගේ දයාන්විත ස්වභාවය මත පදනම්වී ඇති අතර පැකිලීමකින් තොරව විශ්වාසය තැබිය හැකිය.

යාච්ඤාවේ පැතිරීම.

ඊළඟට එය පදනම් වී ඇත්තේ යාච්ඤාවේ පැතිරීම වූ ශ්‍රේෂ්ඨ කාරණය මතය. **“උන්වහන්සේ නුඹේ මොර ගැසීමේ හඬට නුඹට දයා වෙනවාම ඇත.”** දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට යාච්ඤා කිරීමට අවසර ලබාදීම පුදුමයට කාරණයක් නොවේද... ? උන්වහන්සේ මනුෂ්‍යයාට අවසර ලබා දී තිබෙන විට ඔවුන් යාච්ඤා නොකිරීම වඩාත් පුදුමයට කාරණයකි. දෙවියන් වහන්සේ මුනෂ්‍යයෙකුගේ හඬට සවන්දීම පුදුම සහගතය. අපි උත්සාහ කළ බැවින් දෙවියන් වහන්සේ යාච්ඤාව අසන බව දැන් දනිමු. එබැවින් අපි එය ඔබට කියන්නෙමු. උන්වහන්සේ වෙතට ගොස් උන්වහන්සේගෙන් අයැද සිටින්න. මක්නිසාද උන්වහන්සේ ඔබගේ මොර ගැසීමට දයා වෙනවාම ඇත. කරුණාසනයක් පිහිටුවීමට දෙවින් වහන්සේ සතුටුවන සේක. සැක සහිත කෙනෙක් යාච්ඤා කරන විට දෙවියන් වහන්සේ එය නොඅසන සේක් නම් යාච්ඤාව ඉදිරිපත් කිරීමට දිව්‍යමය ලෙස සාදන ලද කරුණාසනයක් තිබිය හැකිද .. ? වදරකරුවන්ට සමාවදීම තුලින් උන්වහන්සේ වෙතට ළඟාවීමට හැකි වන පරිදි උන්වහන්සේ තම ඒක ජාතික පුත්‍රයාණන්ගේ රුධිරයෙන් එම කරුණාසනයට ඉස්සේය. උන්වහන්සේ එම අසමසම රුධිරය වගුරුවා එය විශ්වාස කරන පව්කාරයාව ප්‍රතික්ෂේප කරයිද ..? මේ සියල්ලට අමතරව අප යුතු ලෙස යාච්ඤා කිරීමට නොදන්නා නිසා අපට යාච්ඤා කිරීමට උපකාර කිරීමටත්, අපේ දුර්වලකම්වලදී අපට උපකාර කිරීමටත් ශුද්ධාත්මයාණන් වහන්සේව ලබාදෙන බවට පොරොන්දු වී තිබෙන සේක. උන්වහන්සේ එම ශුද්ධාත්මයාණන් වහන්සේව ලබා දී තවමත් යාච්ඤාව අකාර්යක්ෂමවී දුක්විඳීමට ඉඩ හරිනවාද .. ? එය සිතිය හැකි දෙයක් නොවේ. දෙවියන් වහ්නසේ තම මැවිල්ලේ මොර ගැසීම්වලට සවන්දීමට සතුටු වන සේක. ඔබේ කටහඬ ඉරිතලා නොගැළපෙන එකක් විය හැකි අතර ඔබේ යාච්ඤාව ළදරුවෙකුගේ විලාපයක් මෙන් විය හැකිය. නැතහොත් කුසගින්නෙන් පෙළෙන කුඩුවක සිටින කුඩා කුරුල්ලෙකුගේ කෑගැසීමක් මෙන් විය හැකිය. එම නිසා කපුටුවන් මෙන් අඬන විට නොපැහැදිලි, නොගැළපෙන වචන ඇසෙනු ඇත. එබැවින් උන්වහන්සේ ඉදිරියේ ඔබගේ හදවත වගුරුවන්න.

උන්වහන්සේ ඉතා ඉක්මනින් ඔබට පිළිතුරු ලබාදෙනවා ඇත. **“ඔවුන් යාච්ඤා කරන්ට පළමුවෙන් මම උත්තර දෙන්නෙමි. ඔවුන් කතා කරද්දීම අසන්නෙමි.”** (යොසායා 65:24) හදවතේ කරුණාව තුළ සැබෑ යාච්ඤාව ඇති තැන යාච්ඤාව ඔප්පු කිරීමට පෙර එය අසනු ලබන සේක. මක්නිසාද අපව එවැනි යාච්ඤා කිරීමකට යොමු කරන්නේ කරුණාව නිසාය. කරුණාව අවංකව ඉල්ලන තැනැත්තාට දැනටමත් යම් ප්‍රමාණයකට කරුණාව ලැබී ඇත. එසේ නැති නම් ඔහු තවත් කරුණාව ඉල්ලීමට නැඹුරු නොවනු ඇත. මෙය අපව දිරිමත් කරන්නේය. දෙවියන් වහන්සේ කරුණාව ලබාදීමට බලා සිටින අතර අපගේ මුළු හදවතින්ම උන්වහන්සේ වෙතට හැරී මාගේ පියාණෙනි, මාව මුදාගෙන මට උපකාර කරන්න කියා උන්වහන්සේට මොරගසන්නේ කවුද ?

“උන්වහන්සේ තමන් කෙරෙහි බය ඇත්තන්ගේ ආශාව ඉෂ්ඨ කර දෙන සේක..., (ගීතාවලිය 145:19)

යාච්ඤා කරන පූජකයෙක්

(දේව බට්ස් විසිනි) (1953 - 2022)

පූජකයෙකු ගැන සිතද්දී අප සාමාන්‍යයෙන් සිතන්නේ දෙවියන් වහන්සේ සමඟ විශේෂ සම්බන්ධතාවයක් ඇති අන් අය වෙනුවෙන් උන්වහන්සේ වෙත ළඟා විය හැකි කෙනෙකු ගැනය. විශේෂයෙන් පූජකත්වය විශේෂ පුහුණුවක් ඇති තෝරාගත් කිහිපදෙනෙකුට පමණක් කියන අදහසින් අපි ඇත් වුවහොත් එය වැරදි සංකල්පයක් නොවේ. ශුද්ධ ලියවිල්ලට අනුව ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින සෑම ඇදහිලිවන්තයෙකුවම යේසුස් වහන්සේ තුලින් පූකයෙකු බවට පත්කර ඇත. **"නුඹලාත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කැණුකොටගෙන දෙවියන් වහන්සේට ප්‍රසන්න වූ ආත්මික පූජා ඔප්පු කරන පිණිස ශුද්ධ පූජක සමූහයක් වීමට ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල් මෙන් ගොඩනගනු ලබන්නහුය."** (1 පේතෘස් 2:5) **"නුමුත් අන්ධකාරයෙන් නමන්ගේ විශ්මජනක ආලෝකයට නුඹලා කැඳවාගත් තැනැත්තා වහන්සේගේ උත්කෘෂ්ටතාවයන් දක්වන පිණිස නුඹලා වනාහී තෝරාගත් වංශයක් ද රාජකීය පූජකයෝද, ශුද්ධ වූ ජාතියක් ද දෙවියන් වහන්සේ සන්තක සෙනඟක් ද වන්නහුය."** (1 පේතෘස් 2:9)

දේව රාජ්‍යයේ පූජකයෙකුගේ සියලු වරප්‍රසාද සහ වගකීම් සමඟ අප ගමන් කිරීමට නම් පූජකයෙකුවීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද .. ? කියා අපි තේරුම්ගත යුතුය. යේසුස් වහන්සේම එම පූජකත්වයේ කොටසක් බවත්, අත්ත වශයෙන්ම උන්වහන්සේ අපගේ උත්තම පූජකයා බවත් අපි දකින විට මෙය තේරුම් ගැනීම විශේෂයෙන් වැදගත් වේ. හෙබ්‍රෙව් යැවුම් පත්‍රය සැබවින්ම යේසුස් වහන්සේගේ පූජකත්වය කෙරෙහි අවධානය යොමු කරන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පූජකයන් ලෙස දෙවියන් වහන්සේගේ ගෘහයේ අපගේ ස්ථානය දැකීමට අපට උපකාර කරනු ලබයි.

පූජකයෙකු වශයෙන් යේසුස් වහන්සේට යාච්ඤා කිරීමේ සේවයක් තිබුණු සේක. අපි එය අනුග මනය කිරීම හොඳය. **"නුමුත් ඵුන්වහන්සේ, සදාකාලේටම පවතින හෙයින්, උන්වහන්සේගේ පූජකකම පහවෙන්නේ නැත. එබැවින් උන්වහන්සේ කරුණාකොටගෙන දෙවියන් වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිතරටම ජීවත් වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගලවන්ට උන්වහන්සේට පුළුවන."** (හෙබ්‍රෙව් 7:24-25) **"මැරුණොත් ඒ ඇර මළවුන්ගෙන් නැඟිටුවනු ලැබුවෙත්, දෙවියන් වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස් වහන්සේය."** (රෝම 8:34) යේසුස් වහන්සේ දැන් කරනු ලබන්නේ යාච්ඤාවෙන් මැදහත්කාරකම් කිරීමේ සේවයයි. පූජකයෙකු වශයෙන් උන්වහන්සේගේ කාර්භාරය මැදහත්කරුවෙකුගේ කාර්භාරයයි. අපට ඇති අනර්ඝ පණිවිඩය නම්, උන්වහන්සේ අප වෙනුවෙන් යාච්ඤා කරන බවයි.

දෙවියන් වහන්සේගේ පූජකයන් ලෙස සියලුම කිතුණුවන්ව දැන් මැදහත්කරුවන් ලෙස කැඳවා ඇති බව වටහා ගැනීම වැදගත්වේ. 1 තිමෝති 2:1-2 පදවල පාවුල්තුමා අපව මැදහත්කරුවන් ලෙස යාච්ඤා කිරීමට කැඳවන සේක. එමෙන්ම ඔහු අපට මෙලෙසින්ද පවසයි. **"සියලු යාච්ඤා වලින්ද, ඉල්ලීම්වලින්ද, සියලු කාලවලදී ආත්මයාණන් කරුණාකොටගෙන යාච්ඤා කරපල්ලා."** (එපීස 6:18) දෙවියන් වහන්සේගේ පූජකයන් ලෙස අපගේ භූමිකාව භාරගන්නා විට අපි යේසුස් වහන්සේගේ වත්මන් මැදහත්වීමේ දේව සේවයට එකතු විය යුතුය.

පහතින් සඳහන් වන බයිබල් පදවල හෙබ්‍රෙව් කතුවරයා අපගේ මැදහත්කම් කිරීමේ දී අප ටමහත් දිරිගැන්වීමක් ලබාදෙයි. **"එබැවින් සහෝදරවරුනි, යේසුස් වහන්සේ ස්වකීය මාංශය නැවති තිරය මැදින් අප උදෙසා කැප කළා වූ මාර්ගය වන අළුත් වූ ජීවමාන මාර්ගයකින් උන්වහන්සේගේ ලේ කරුණාකොටගෙන ශුද්ධස්ථානයට ඇතුල්වීමට අපට සිදහස්කම තිබෙන බැවින්ද දෙවියන් වහන්සේගේ ගෘහය කෙරෙහි අපට උතුම් වූ පූජකයෙක් සිටින බැවින්ද, නපුරු හෘදය සාක්ෂියකින් පිරිසිදුවීම පිණිස අපගේ සිත් ඉසිනු ලැබ අපගේ ශරීරය පිරිසිදු වතුරෙන් සෝදනු ලැබ සැබෑ වූ සිතක් ඇතිව ඇදහීමේ නිසැකකමින් ළඟාවෙමු."** (හෙබ්‍රෙව් 10:19-22) මෙම බයිබල් ඡේදය තුළ පූජකයෙකුට යාච්ඤා කිරීමට සුදුසු ස්ථානයක් ඇති බව පවසයි. ඒ අතිශුද්ධස්ථානයයි. අපගේ ලෝකය තුළ අති පූජණීය ස්ථානයක් විය. යුදෙව්වන්ගේ උත්තම පූජකයා අවුරුද්දකට වරක් එහි ඇතුලු විය. මැදහත්කාරකම් කරමින් සෙනඟ උදෙසා පූජාවක් ඔප්පු කරනු ලබන්නේය. එය දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය පවතින ස්ථානයේ විය. පරණ ගිවිසුමේ යුදෙව්වෙකු ලෙස ජීවත්වී සෑම වසරකම උත්තම පූජකයා දේව මාළිගාවට ඇතුල් වන ආකාරය දෙස බලා සිටින ස්වභාවය ඔබට සිතාගත හැකිද .. ? අතිශුද්ධස්ථානයට ඇතුල්විය හැක්කේ උත්තම පූජකයාට පමණි. එය අවුරුද්දකට වරක් ලැබෙන වරප්‍රසාදයකි.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ලේ නිසා අපි කැමති ඕනෑම අවස්ථාවකද අතිශුද්ධස්ථානයට ඇතුල්වීමේ පුදුමාකාර වරප්‍රසාදයක් ඇතිව අප පූජකයන් වී සිටින්නෙමු. අපි යාච්ඤා කරන විට අපි ස්වාමීන් වහන්සේගේ අභිමුඛත්වයට ප්‍රවේශවීම තුළින් අපට දී ඇති විශ්මිත වගකීම මෙන්ම අනර්ඝ වූ ස්වභාවයේ ගෞරවය නොදනිති. යාච්ඤා කිරීමේදී පූජකයෙකුට නිවැරදි ආකල්පයක් තිබෙන බව හෙබ්‍රෙව් 10 වන පරිච්ඡේදයේ අපට දැකිය හැකිය. අපි යාච්ඤා කරන විට අපට විශ්වාසය සහ සහතිකය තිබිය යුතුය. මෙය අප තුළ ඇති විශේෂත්වයක් නිසා නොව අපගේ ස්වාමීන් වහන්සේ වන යේසුස් වහන්සේ විශේෂ කෙනෙකු නිසාය. අපි දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයට ඇතුල් වන්නේ උන්වහන්සේ හරහාය. අපගේ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට සහ මැදහත්වීම් දැනුම්දීමට අපට ආරාධනා කරන සේක.

හෙබ්‍රෙව් පොතේ අපට පවසන්නේ ඇදහිල්ලෙන් පූර්ණ සහතිකය තුළ අවංක හදවතකින් ළඟාවන ලෙසයි. අප දෙවියන් වහන්සේට ළංවුවහොත් උන්වහන්සේ අපට ළංවන බව යාකොබ් අපට පවසයි. අපි යාච්ඤා කරන විට අපගේ ඇදහිල්ල සහ විශ්වාසය වර්ධනයවීමට එම සත්‍යය හේතු කාරක වන්නේ කෙසේද ? ස්වාමීන් වහන්සේගේ කැමැත්තට අනුව කරන සෑම යාච්ඤාවකටම සවන්දී පිළිතුරු ලබදීමට දෙවියන් වහන්සේ සූදානම්ව සිටින බවට අපට විශ්වාසය තැබිය හැකිය. අපෝස්තුළු යොහාන් අපට මෙලෙස උපදෙස් දෙනු ලබයි. "උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කළ උන්වහන්සේ අසන බව අපි දනිමු නම් අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව. (1 යොහාන් 5:14-15) පූජකයෙකුටද අනුගමනය කළ යුතු නිවැරදි ආදර්ශයක් ඇත. අපගේ උත්තම පූජකයා සහ මැදහත්කරුවාණන් වන යේසුස් වහන්සේ අපගේ ආදර්ශයයි. උන්වහන්සේගේ පියවර අනුගමනය කිරීමට අපට අණකර ඇත. යේසුස් වහන්සේගේ යාච්ඤාවේ බලය ගැන ගෝලයන් කොයිතරම් පැහැදුනාද කියනවා නම්, ඔවුන්ටත් යාච්ඤා කිරීමට උගන්වන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටියෝය. යේසුස් වහන්සේගේ ප්‍රතිචාරය වූයේ යාච්ඤාව පිළිබඳව දේශනාවක් කිරීමට නොව ඔවුන්ට ආදර්ශමත් යාච්ඤාවක් ලබාදීමයි. එක් අර්ථයකින් යේසුස් වහන්සේ පැවසුවේ මෙන්න දළ සටහනක් මෙය ඔබගේ යාච්ඤාවට ඇතුළත් කර ගැනීමට වගබලාගන්න. රාජ්‍යයේ කාරණා ගැන යාච්ඤා කිරීමට වගබලාගන්න. අපි යාච්ඤාව ගැන යේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුගමනය කරන විට අපි හොඳම ආකාරයෙන් යාච්ඤා කරන්නෙමු.

දෙවියන් වහන්සේගේ පූජකවරුනි, ස්වාමීන් වහන්සේම අන් අප වෙනුවෙන් මැදහත්කරුවෙකු ලෙස උන්වහන්සේ ඉදිරියේ සිටගෙන උන්වහන්සේගේ බලය ඔවුන්ගේ ජීවිතවලට මුදාහරිමින් මේ ලෝකයේ වෙනසක් ඇති කිරීමට ආරාධනා කරනු ලබයි. ශුද්ධ ලියවිල්ලේ පූජක මැදහත්වීම පිළිබඳව හොඳම උදාරහණ වලින් එකක් ගණන් කතාව පොතේ දකින්නට ලැබේ. ඊශ්‍රායෙල් සෙනඟ මෝසෙස්ගේ සහ ආරොන්ගේ නායකත්වයට විරුද්ධව මැසිවිලි නැගුවෝය. එම නිසා දෙවියන් වහන්සේ සෙනඟ අතරට වසංගතය එවූ බැවින් සෙනඟ මරණයට ගොදුරු වෙමින් සිටියෝය. සුවඳ දුම් ශුද්ධවන්තයන්ගේ යාච්ඤාවට සංකේතවත් වන අතර එය මතක තබා ගනිමින් පහත සඳහන් බයිබල් ඡේදය තුලින් ඔබගේ හදවත ප්‍රබෝධමත් කිරීමට ඉඩදෙන්න. **"එවිට මෝසෙස් ආරොන්ට කතාකොට, නුඹේ දුප භාජනය රැගෙන පූජාසනයෙන් ගිනි අරන් එහි බහා සුවඳ ද්‍රව්‍යලා වහාම සභාව ළඟ ගෙන ගොස් ඔවුන් උදෙසා සමගිකමක් කරපන්න. මක්නිසාද ස්වාමීන් වහන්සේ කෙරෙන් උදහස නික්ම ගියේය. වසංගතය පටන් ගත්තේ යයි කීවේය. ආරොන් මෝසෙස් කී ලෙස රැගෙන සභාව මැදට දිවීය. බලව සෙනඟ අතරෙහි වසංගතය පටන්ගෙන තිබුණේය. ඔහු සුවඳ ද්‍රව්‍යලා සෙනඟ උදෙසා සමගිකමක් කළේය. එසේ ඔහු මළවුන්ටත් ජීවතුන්ටත් අතරේ සිටියේය. එවිට වසංගතය නැවතුණේය."** (ගණන්කථාව 16:46-48)

දෙවියන් වහන්සේගේ පූජකයෙක් වශයෙන් අපි ජීවතුන් සහ මළවුන් අතර සිටිය යුතුය. මනුෂ්‍යයන්ගේ අවශ්‍යතාවය උදෙසා මැදහත්කාරකම් කරමින් ශුද්ධ වූ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයට ඒවා ගෙන එමින් වෙනස් කරනු ලැබිය යුතුය. මෙය යාච්ඤා කරන පූජකයෙක්වීමට දෙවියන් වහන්සේගේ කැඳවීම සභාව බැරෑරුම් ලෙස පිළිගත යුතු කාලයයි.

අපගේ යාච්ඤාවලට පිළිතුරු ලැබෙන පදනම

(ජෝර්ජ් මුලර් විසිනි) (1805 - 1898)

"ඉල්ලාපල්ලා එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා එවිට සම්බවේ. තට්ටු කරපල්ලා එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නා වූ සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටු කරන්නාට දොර හරිනු ලැබේ." (මතෙව් 7:7-8)

යාච්ඤාව සම්බන්ධයෙන් අපගේ අනර්ඝ වූ, ආදරණීය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මුවින් ප්‍රකාශ කරන ලද පොරොන්දුව අපට අවශ්‍ය තරම් සම්පූර්ණව, විශාලව සහ අනර්ඝව තිබෙන අතර ක්‍රිස්තුස් වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි, යාච්ඤා කිරීම සම්බන්ධයෙන් අප විසින්ම පොරොන්දු විය යුතු බව අපට ඉතිරි කර දුන්නේ නම් එය අපට ලබා දී ඇති ප්‍රමාණයට වඩා විශාල කරගන්නේ කෙසේදැයි මම නොදනිමි. අප කුඩා දරුවෙකු මෙන් මෙම වචනය අල්ලා ගැනීමට උත්සාහ කළ යුතුය. මක්නිසාද දෙවියන් වහන්සේගේ වචනය අල්ලා ගැනීම ඇදහිල්ලයි. දෙවියන් වහ්නසේගේ වචනයේ පවසන දේ ප්‍රශ්න නොකර ඒ මත රැඳී සිටීමෙන් එය සත්‍ය යැයි පිළිගත යුතුය.

බොහෝ දෙනා සිතන්නේ ඇදහිල්ල විශේෂයෙන් ගැඹුරු හැඟීමකින් සමන්විත බවයි. මෙය විශාල වැරැද්දකි. දෙවියන් වහන්සේගේ වචනය උන්වහන්සේගේ සත්‍යතාවය ලෙස පිළිගෙන ඒ මත රැඳී සිටීමින් දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ වචනයට අනුව

8 පිටුවට

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටුවෙන්

අපගේ යාච්ඤාවලට පිළිතුරු...

ක්‍රියා කරන බව ළමයෙක් මෙන් විශ්වාස කරන විට ඒ පුද්ගලයා තුළ ශක්තිමත් ඇදහිල්ලක් පවතියි. (1 තෙසලෝනික 2:13) මේ අනුව දෙවියන් වහන්සේගේ වචනය ලබාගෙන ඒ මත රැඳී සිටීමට හැකි වන පුරුෂයා සහ ස්ත්‍රිය ඇදහිල්ලේ ශක්තිමත් අයයි. අපි අඛණ්ඩව ඉලක්ක කල යුත්තේ එයයි. දෙවියන් වහන්සේගේ වචනයෙන් තෘප්තිමත්වී දෙවියන් වහන්සේගේ වචනයේ අපට පෙන්වා දී තිබෙන දේ අපි අපටම කියා ගැනීමේ දී එය සිදුවනු ඇත.

ශුද්ධ ලියවිල්ල, ශුද්ධ ලියවිල්ල සමඟම සසඳන්න

මතෙව් 7:7-8 එවැනි පොරොන්දුවකි. එය අපි අපගේ සිතට ගත යුතුය. එය අපගේ සිත තුළ තැන්පත් කරගෙන මෙලෙස පැවසිය යුතුය. මාගේ දෙවියන් වහන්සේ සහ මාගේ පියාණන් වහන්සේ, උන්වහන්සේගේ වචනයට අනුව ක්‍රියා කරනවා ඇත. උන්වහන්සේගේ ශුද්ධ වූ දරුවන් වන සභාවට යේසුස් වහන්සේ මෙම පොරොන්දුව ලබාදී තිබෙන සේක. නමුත් මෙම පොරොන්දුවේ වචනය ඉතා විශාල, සම්පූර්ණ සහ ගැඹුරු, ඉතා වටිනා වුවද, අපි තවදුරටත් උපදෙස් ලබා ගැනීමටත් අපගේ හදවත් තවදුරටත් විශාලවීමටත්, අපව වඩාත් ස්ථිරව තබා ගැනීමටත්, මෙම බයිබල් කොටස සම්බන්ධයෙන් දෙවියන් වහන්සේගේ හදවතේ ඇති දේ වඩාත් පැහැදිලිව දැකීමටත් ශුද්ධ ලියවිල්ලේ අනිත් කොටස් සමඟ සසඳන්න.

උදාහරණයක් වශයෙන් යාකොබ්ගේ ලිපියේ සඳහන්ව ඇති පරිදි යාච්ඤාව සම්බන්ධ වචනයත් සසඳන්න. එහි අපි මෙසේ කියවන්නෙමු. **"නුඹලා ඉල්ලන නමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම් කරන පිණිස වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත."** (යාකොබ් 4:3) එවැනි වචනයක් අත්හැරීමට නොහැකිය. එම නිසා යාච්ඤාව සම්බන්ධ පොරොන්දුව සමඟ එය සසඳන්න. යාකොබ් මෙය සඳහන් කරන්නේ කිතුණුවන් ලෙස කැඳවනු ලැබූ ස්වාමීන් වහන්සේගේ ගෝලයන් ලෙස හැඳින්වූ යාච්ඤාවෙන් තොරව සිටි අය ගැනයි. එය අපට පෙර පදයේ අවසාන කොටසේ දකින්නට ලැබේ. **"නුඹලා ඔබාදෑ, යුද්ධද කරන්නහුය. නුඹලා නොඉල්ලන බැවින් නුඹලට නොලැබෙන්නේය."** (යාකොබ් 4:2[B])

සමහර අය යාච්ඤා කළේ නැත. තවත් සමහර අය යාච්ඤා කළ නමුත් නිවැරදි ලෙස යාච්ඤා කළේ නැත. **"නුඹලා ඉල්ලන නමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම් කරන පිණිස වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත."** (යාකොබ් 4:3) මෙහි ඇති ප්‍රශ්නය ස්වභාවිකව ඉල්ලා සිටියත් වරුදි ලෙස ඉල්ලා සිටීම බව අවබෝධ කරගත යුතුය. වැරදි ලෙස ඉල්ලා සිටීම යන්නෙහි අර්ථය ශුද්ධාත්මයාණන් වහන්සේ පැහැදිලි කරන සේක. ("නුඹලා තෘෂ්ණා ගැන වියදම් කරන පිණිස වැරදි ලෙස ඉල්ලා සිටියි") එනම් පුද්ගලයන් තම ලෞකික මනස තෘප්තිමත් කිරීම සඳහා දේවල් ඉල්ලා සිටින්නේ නම්, එනම් ඔවුන්ට විනෝදවීමට ඔවුන් තුළ ඇති පරණ පාපිෂ්ඨ දූෂිත ස්වභාවය ශක්තිමත් කිරීමට ඉල්ලා සිටියි. ඔවුන්ගේ යාච්ඤාවලට පිළිතුරු ලැබෙනු ඇතැයි අපේක්ෂා කිරීමට ඔවුන්ට ශුද්ධ ලියවිල්ලෙන් සහතිකයක්, බලයක් ලබාදෙන්නේ නැත.

නමුත් එය එසේ නොවී අපි දෙවියන් වහන්සේගේ මහිමය උදෙසා ඉල්ලා සිටින්නේ නම්, අපි වැරදි ලෙස ඉල්ලා සිටින්නේ නැත. දැන් මෙය යාච්ඤාව සම්බන්ධයෙන් පලමුවෙනි ප්‍රාථමික කාරණය ලෙස පෙනෙන අතර යාච්ඤාව සම්බන්ධයෙන් දෙවියන් වහන්සේගේ දරුවන්ගේ කල්පනාවේ නිතරම මෙය තැබිය යුතුය. **"එහෙයින් නුඹලා කනත්, බොනත් වෙන යමක් කරනත් සියල්ල දෙවියන් වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා"** (1 කොරින්ති 10:31)

මෙය අපගේ හොඳකමක් නොව නමුත් උන්වහන්සේගේ යහපත්කමයි.

තවත් ගැඹුරු කාරණයක් නම්, අපගේම දක්ෂතාවයන් සහ සුදුසුකම් යන පදනම මත සියලු දේ අපේක්ෂා කිරීම ඉවත දැමිය යුතු බවයි. ඒ වෙනුවට අපගේ යාච්ඤාවලට පිළිතුරු ලැබීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වටිනාකම් සහ සුදුසුකම් අයැද සිටිමු. අලුත් ගිවිසුමේ සාමාන්‍යයෙන් එය ප්‍රකාශ කරන පරිදි ස්වාමී වූ යේසුස් වහන්සේගේ නාමයෙන් ඉල්ලා සිටිමු. (කොලොස්සි 3:17, යොහාන් 15:16) දැන් පව්කාරයාට තමාගේ යහපත්කම් වලින් සහ සුදුසුකම් මත ස්වර්ග යට යාමට නොහැකිසේම අපගේ අනර්ඝ වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ලෙන් උන්වහන්සේගේ යහපත්කම, දුක්විඳීම් මත පමණක් දෙවියන් වහන්සේ ඉදිරියට පැමිණිය හැකි බව අපේක්ෂා කළ යුතුය. එබැවින් දෙවියන් වහන්සේගේ දරුවන් වන අපි යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ වෙතට පැමිණීමේ දී අපගේම කුසලතාවයන් සහ අපගේම සුදුසුකම් මත රැඳී නොසිට ඒවා අත්හැරිය යුතුය.

අපි අපවම ප්‍රතික්ෂේප කර යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ඇළුම් විය යුතුය. නැවත නැගිටුණුවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ එක්සත් වී, උන්වහන්සේ තුළ සැඟවී, ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඉදිරියට යමින් ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ යහපත්කම් සහ සුදුසුකම් මත දෙවියන් වහන්සේගෙන් අයැද සිටිය යුතුය. දෙවියන් වහන්සේ එබඳු අයගේ යාච්ඤාවලට පිළිතුරු ලබාදෙන සේක. දැන් අපගේ සැනසීම මෙයයි. අනර්ඝ වූ ස්වාමීන් වන්සේ වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම පියාණන් වහන්සේ වන දෙවියන් වහන්සේගෙන් සියල්ල ලැබීමට සුදුසු වන අතර උන්වහන්සේගේ යහපත්කම පරිපූර්ණ නිසා උන්වහන්සේගේ නොකැළැල් ශුද්ධකම නිසා උන්වහන්සේගේ මැදහත්කාරකමේ පදනම මත එය ලබාදීමට කැමැත්තෙන් සිටින සේක. මෙලෙස අපි යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ වෙත ළඟාවන්නේ නම් එම කාරණය සම්බන්ධයෙන් ගත් කළ අපගේ යාච්ඤාවලට පිළිතුරු අපේක්ෂා කිරීමට අපට සම්පූර්ණ හැකියාවක් තිබේ.

නුඹලා කොයිදෙයක් ඉල්ලුවත් මම ඒක ඉෂ්ඨකරන්නේ නම් (යොහාන් 14:14)

තවත් ගැඹුරු කාරණයක් නම් අපි ඇදහිල්ල තුළ දෙවියන් වහන්සේගේ බලය පාවිච්චි කරමින් යාච්ඤාවට පිළිතුරු ලබා ගැනීමට දෙවියන් වහන්සේගේ කැමැත්ත තුළ ඇදහිල්ල පාවිච්චි කිරීමයි. දෙවියන් වහන්සේගේ දරුවන් අතරේ ඉතාම ස්වල්ප දෙනෙක් උන්වහන්සේගේ බලය ගැන ප්‍රශ්න කරති. අපෙග් යාච්ඤාවට පිළිතුරුදීමට දෙවියන් වහන්සේගේ කැමැත්ත සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට පෙළඹීම සාමාන්‍යයෙන් බහුලව තිබේ. දෙවියන් වහන්සේට එය කළ හැකිය. අපි ඉඩ දෙන්නෙමු. නමුත් එය කිරීමට උන්වහන්සේ කැමතිද ..? දැන් අපි අපටම මෙසේ කියා ගත යුතුය. දෙවියන් වහන්සේ අපට දිය යුතු හොඳම තෑග්ග වන උන්වහන්සේගේ ඒකජාතික පුත්‍රයා පවා අප උදෙසා දී ඇති අතර දෙවියන් වහන්සේ පොරොන්දු වී තිබෙන ලෙස උන්වහන්සේගේ කරුණාවේ මාර්ගයන් ක්‍රිස්තුස් වහන්සේ තුළ අපට ලබා දී තිබෙන සේක. අනිත් සියලුදේත් යේසුස් වහන්සේ තුළ අපට ලබාදෙන බවට පොරොන්දු වී තිබෙන සේක. (රෝම 8:32)

පොරොන්දු වී තිබෙන වචනය මත රැඳී සිටීමින් මෙලෙස පැවසිය යුතුය. දෙවියන් වහන්සේට මම ඉල්ලන දේ ලබාදිය හැකි අතර මම උන්වහන්සේගේ නාමයෙන් ඉල්ලන තරමට එය ලබාදෙන සේක. එය නිසැකවම මම ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වරප්‍රසාදය සහ සුදුසුකම මත ඉල්ලා සිටින්නාසේම, ක්‍රිස්තුස් වහන්සේ උදෙසාත්, ක්‍රිස්තුස් වහන්සේ සමගත් මම උන්වහන්සේගෙන් ඉල්ලා සිටින දේ උන්වහන්සේගේ හස්තයෙන් ලබාදෙනු ඇත. මම මේ ගැන අධාරණය කරන්නේ මම ස්වාමීන් වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේව දැන සිටි වසර ගණනාව තුළ මම යාච්ඤා කරන සැමවිටම මා ඉල්ලන දේ මට ලබාදෙනු ඇතැයි විශ්වාස කරද්දී එය නිසැකවම හිමිවන බව මා දැක ඇති බැවිනි. (මාර්ක් 11:24)

"යේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙවින්, දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇතුව සිටපල්ලා. සැබෑවක් නුඹලාට කියමි. කවරෙක් නමුත් මේ කන්දට කතාකොට ඉදිරි මුහුදේ වැටී යන්නැයි කියා තමාගේ සිතින් සැක නොකොට තමා කියන දේ සිදුවේ යැයි අදහන්නේ නම්, ඒක ඔහුට සිදුවන්නේය. එබැවින් නුඹලාට කියමි. නුඹලා යාඤ්ඤාකොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේ යයි අදහාපල්ලා. ඒවා නුඹලාට ලැබෙන්නේය. නුඹලා යාච්ඤා කරවින් සිටින කළ ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් වහන්සේ නුඹලාගේ වරද නුඹලාට කමා වෙන පිණිස යමෙකුට විරුද්ධව යමක් නුඹලාට ඇත්නම් නුඹලාත් කමාවෙයල්ලා. නමුත් නුඹලා කමා නොවෙනවා නම් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් වහන්සේ නුඹලාගේ වරදවලටත් කමා නොවන සේක." (මාර්ක් 11:22-26)

"තවද නුඹලා ඇදහිල්ල ඇතුව යාච්ඤාවෙන් ඉල්ලන කොයි දෙයක් නමුත්, ඒ සියල්ල නුඹලාට ලැබේ යයි ඔවුන්ට කී සේක." (මතෙව් 22:22)

"යේසුස් වහන්සේ උත්තර දෙවින්, ඔබට පුළුවන් නම්, විශ්වාස කරන්නට සියල්ල පුළුවනැයි කී සේක." (මාර්ක් 9:23)

ඉතිරි කොටස රිලඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.